## හැඳින්වීම

ශ්‍රී ලංකා සමුපකාර විද්‍යාලය, ජාතික සමුපකාර සංවර්ධන ආයතනය ලෙස ප්‍රතිසංවිධානය කරන ලද්දේ එතෙක් පැවති සමුපකාර අධ්‍යාපන සම්ප්‍රදායයෙන් මිදී ගෝලීයකරණයට මුහුණ දියහැකි නව උපායමාර්ග හා ක්‍රමවේදයන් සපිරි අධ්‍යාපනයක් සමුපකාර ව්‍යාපාරයට ප්‍රදානය කිරීමේ අභිලාෂයෙනි.

සමුපකාර ව්‍යාපාරය මෙන්ම සමුපකාර අධ්‍යාපනය ද ගෝලීයකරණයට මුහුණ දියහැකි අයුරින් ස්වාධීනව පවත්වා ගැනීම සඳහා ව්‍යවස්ථාපිත ආයතනයක් ලෙස 2001 අංක 01 දරණ ජාතික සමුපකාර සංවර්ධන ආයතනය (සංස්ථාගත කිරීමේ) පනතේ විධිවිධාන යටතේ 2001 ජූලි මස 01 දින මෙම ආයතනය පිහිටුවන ලදි.

රජයේ ප්‍රමුඛ අමාත්‍යාංශ කිහිපයක නියෝජිතයින්ගෙන් හා රාජ්‍ය හා පෞද්ගලික අංශවල වෙනත් විද්වත් පුද්ගලයින්ගෙන් සමන්විත කළමනාකරණ මණ්ඩලයක් මඟින් ආයතනයේ කටයුතු කළමනාකරණය කිරීම කළමනාකරණ මණ්ඩලය වෙත පැවරේ.

වෘත්තීය අධ්‍යාපනය දියුණු කිරීම තුළින් නිපුණතා සංවර්ධනය වැඩිදියුණු කිරීමටත්, ජාතික වශයෙන් පමණක් නොව ජාත්‍යන්තර මට්ටමේ අධ්‍යාපන හා පුහුණු ක්‍රමවේදයන්ට අනුගතවීමත් සැළකිල්ලට ගනිමින් නව ආයතනය ක්‍රියාත්මක වේ. මෙම අපේක්ෂාවන් ඉටුකරගැනීම සඳහා හිතකර වූ අධ්‍යාපනික පරිසරයක් හා ඉඩ පහසුකම් මෙම ආයතනය සතුව පැවතීම එම කටයුතු සාර්ථකව ඉටුකර ගැනීමට ප්‍රබල සාධකයක් වී ඇත.

සමාලෝචිත වර්ෂය තුළ සමුපකාර අංශයේ මෙන්ම රාජ්‍ය අංශයේ නිලධාරීන් පුහුණු කිරීම සඳහා ඩිප්ලෝමා පාඨමාලා, සහතිකපත්‍ර පාඨමාලා හා විෂයානුබද්ධ කෙටිකාලීන පාඨමාලා සහ කළමනාකරණ සංවර්ධන පුහුණු වැඩසටහන් රාශියක් ක්‍රියාත්මක කරන ලදී.

## සභාපතිතුමාගේ පණිවිඩය

ගෝලීය ගතික අවශ්‍යතාවයන් ආමන්ත්‍රණය කිරීමට අවශ්‍ය පරිදි සමුපකාර ව්‍යාපාරයෙහි මානව ප්‍රාග්ධනයට ප්‍රමුඛත්වය ලබාදී මින් සමස්ථ ලාංකේය මානව ප්‍රාග්ධනය සංවර්ධනය කිරීමේ පරමාර්ථයෙන් 2001 අංක 01 දරණ පාර්ලිමේන්තු පනතින් පිහිටුවන ලද ජාතික සමුපකාර සංවර්ධන ආයතනයෙහි 2012 වර්ෂයේ වාර්ෂික වාර්තාව වෙනුවෙන් මෙම සටහන තබනුයේ ඉමහත් සතුටිනි.

මහින්ද චින්තන ඉදිරි දැක්ම ප්‍රතිපත්ති වැඩපිළිවෙල යටතේ ආශ්චර්යමත් ශ්‍රී ලංකාවක් ගොඩනැගීම වෙනුවෙන් සමුපකාර ව්‍යාපාරයේ කාර්යභාරය ඉටුකිරීම සඳහා නව ප්‍රවේශයක් යටතේ පුහුණුව හා අධ්‍යාපනය විවිධාංගීකරණය කිරීමට හා අනෙකුත් සියළු පහසුකම් උසස් මට්ටමකට ගෙන ඒමටත්, එමගින් ආයතනික ඉපයීම් වර්ධනය කර ගැනීමට හැකිවීමත් 2012 වසරේදී අප ලද සුවිශාල ජයග්‍රහණයකි.

නිත්‍ය කාර්යභාරයෙන් පියවර කීපයකින් ඉදිරියට තැබූ 2012 වර්ෂය ශ්‍රී ලාංකේය වෘත්තීය අධ්‍යාපනයේ අවස්ථාවන් පුළුල් කිරීමේදී රාජ්‍ය ආයතනයක් වශයෙන් වෘත්තීය ගණකාධිකරණය, බැංකුකරණය, භාෂා ක්ෂේත්‍රය, තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රය ආවරණය කිරීම සඳහා වූ පාඨමාලා වඩාත් ශක්තිමත් කරනු ලැබීය. එමෙන්ම නිත්‍ය පුහුණු පාඨමාලාවන් NVQ ප්‍රමිතීන් මත පිහිටා නවීකරණය කිරීමට මූලික ක්‍රියාමාර්ග ගත හැකි වීමද සුවිශේෂී කඩඉමකි.

ජාතික මට්ටමේ ශ්‍රවනාගාරයක් දායාද කිරීමේ වැඩපිළිවෙල ඉදිරියට ගෙනයාම, දැයට කිරුළ ජාතික සංවර්ධන වැඩසටහන් වෙනුවෙන් සුවිශේෂී දායකත්වයක් ලබාදීමට හැකිවීම ආයතනයේ ශක්තිය වර්ධනය වීමක් ලෙස සඳහන් කරමි. මෙම සියළු කාර්යයන් හිඳී ධෛර්යෙන් හා කැපවීමෙන් කටයුතු කරන කළමනාකරණ මණ්ඩලය, අධ්‍යක්ෂ ජනරාල් ප්‍රමුඛ සමස්ථ කාර්ය මණ්ඩලයේ කැපවීම අගය කොට සළකමි.

භෞතික හා මානව සම්පත් සංවර්ධනය වෙනුවෙන් ඉදිරි පියවර රැසක් ඉටුකළ හැකි වීමත් ඒ සෑම ක්‍රියාවලියකදීම ආසියාවේ ආශ්චර්යවත් රටක් කරා පියනැඟීමට සමුපකාර ව්‍යාපාරය දිරි ගැන්වීම සඳහා ආයතනය තබන සෑම පියවරක්ම සාර්ථක වේවායි එක සිතින් ප්‍රාර්ථනය කරමි.

නීතිඥ ලක්මාල් රත්නායක,
සභාපති,
ජාතික සමුපකාර සංවර්ධන ආයතනය,
පොල්ගොල්ල.

## අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවිඩය

ශ්‍රී ලාංකේය සමුපකාර ව්‍යාපාරයේ මානව සම්පත සතු ධාරිතාවය ප්‍රවර්ධන කිරීම සඳහා කැපවී ඇති ශ්‍රී ලංකා සමුපකාර විද්‍යාලය 2001 අංක 01 දරණ පාර්ලිමේන්තු පනතින් ජාතික සමුපකාර සංවර්ධන ආයතනය නමින් ව්‍යවස්ථාපිත ආයතනයක් බවට පත් කර ආයතනයේ ව්‍යුහාත්මක වෙනස්කම් සමඟ සංවර්ධනාත්මක පසුබිම පුළුල් මට්ටමකට ගෙන එනු ලැබීය.

නව දැක්මක් සහිත සමුපකාර ව්‍යාපාරයක් තුළ කළමනාකරණ හැකියාව හා තාක්ෂණික නවීකරණයෙන් සමන්විත මානව සම්පතක් බිහි කිරීම සඳහා ජාතික සමුපකාර සංවර්ධන ආයතනය ක්‍රියාකරමින් සිටියි. මෙම වර්ෂය තුළ වෙනත් වෘත්තීය පාඨමාලාවලට අමතරව ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ වෘත්තීය පාඨමාලා සඳහා පුහුණු කටයුතු ආරම්භ කිරීම තුලින් පාඨමාලා විවිධාංගිකරණය හා භෞතික සම්පත් උපයෝජනය තවදුරටත් පුළුල් කිරීමට හැකි විය.

ව්‍යාපාරයේ විවිධ පාර්ශවකරුවන් සමඟ ඵලදායි සම්බන්ධතා ගොනුකර ගනිමින් සමස්ත සමුපකාර ව්‍යාපාරයේ අවශ්‍යතාවයන් සෘජුවම ඉලක්ක කර ගත් පුහුණු වැඩසටහන් වැඩි ප්‍රමාණයක් ක්‍රියාත්මක කරවීම තුලින් වඩාත් ඵලදායි දායකත්වයක් මෙම ආයතනය තුලින් සමුපකාර ව්‍යාපාරයට ලබාදීමට හැකිවිය.

මෙම වර්ෂයේ ආයතනික සමස්ත කාර්ය භාරය සාර්ථක කර ගැනීම සඳහා විවිධාකාරයෙන් මඟපෙන්වීම් අනුග්‍රහය හා  දායකත්වය ලබාදුන් සැමට කෘතවේදීත්වය පළකරමි.

ඩබ්. ඒ. ආර්. විමලසිරි,
අධ්‍යක්ෂ ජනරාල්,
ජාතික සමුපකාර සංවර්ධන ආයතනය,
පොල්ගොල්ල.

## දැක්ම

ශ්‍රී ලංකාව තුළ තිරසාර පැවැත්මක් සහිත නිර්මාණශීලී හා නව්‍යකරණයෙන් යුත්, ගෝලීය සම්බන්ධතාවයන්ගෙන් පිරිපුන් සමුපකාර ව්‍යාපාරයක් ස්ථාපිත කිරීම.

## මෙහෙවර

යහපාලනයෙන් හා නිර්මාණශීලීත්වයෙන් යුත් සාමූහික සහභාගිත්වය තහවුරු කෙරෙන ස්වාධීන හා තිරසාර සමුපකාර ව්‍යවසායයක් බිහිකිරීම සඳහා අවශ්‍ය මානව ප්‍රාග්ධනය සංවර්ධනය කිරීම.

# අපගේ පස්විධ වටිනාකම් (Our Values)

**අපගේ පස්විධ වටිනාකම්**

**නව්‍යතාවය හා නිර්මාණශීලිත්වය**

සමුපකාර ව්‍යවසායේ වර්ධනයක් සඳහා අත්‍යවශ්‍ය සාධක ලෙස නව්‍යතාවය හා නිර්මාණශිලිත්වය හඳුනා ගනිමු. මේ සඳහා සමුපකාර දර්ශනය තුළ නව වැඩසටහන් හඳුන්වාදීම මගින් සහ වෙනත් නව ප්‍රවේශයන් එළිදැක්වීම තුලින් ව්‍යවසායයෙහි කාර්යසාධනය ඉහළ තලයකට ගෙන ඒම අපගේ අභිප්‍රායයි.

**පාරිභෝගිකයා අරමුණු කර ගැනීම**

සමුපකාරික ප්‍රජාව අපගේ පාරිභෝගිකයායි. ඔවුන්ගේ තත්ත්වය හෝ තරාතිරම නොබලා සැමටම එකලෙස ගෞරවය දක්වමින් අවබෝධයෙන් යුතුව සමානව සැලකීමට අපි අපේක්ෂා කරමු.

**කාර්ය මණ්ඩලයට ඉහළ වටිනාකමක් ලබාදීම**

ආයතනය තුළ යෝග්‍ය වැඩ පරිසරයක් සකස් කිරීම තුලින් කාර්ය මණ්ඩල අභිප්‍රේරණ සාධක ඉහළ මට්ටමකට ගෙන ඒම සහ එමගින් ඔවුන්ගේ කාර්යඑල සඳහා වටිනාකමක් ජනිත කිරීම අපගේ තවත් අපේක්ෂාවකි.

**ගුණාත්මක මට්ටමේ සේවා බෙදා හැරීමක් සිදු කිරීම**

අපගේ සියළුම සේවාවන්වල ඉහළ වටිනාකමත්, විශිෂ්ට භාවයත් අප තහවුරු කරන්නෙමු.

**සාමුහික ක්‍රියාකාරිත්වය**

හැකි උපරිම ආකාරයට ආයතනික ක්‍රියාවලිය තුළ පවතින සෑම අංශයකම පාරිභෝගිකයා අපේක්ෂිත මට්ටමේ ගුණාත්වයක් ආරක්ෂා කිරීම තුලින් හොඳ සේවා බෙදා හැරීමක් සිදු කිරීම අපගේ අපේක්ෂාවයි.

## ආයතනයේ අභිමතාර්ථ හා අරමුණු

### 1. ශ්‍රී ලංකා සමුපකාර ව්‍යාපාරයේ නියුතු මානව ප්‍රාග්ධනය ඵලදායි ලෙස සංවර්ධනය කිරීම

01. සමුපකාර සංවිධානවල ඉහළ කළමනාකරණයේ වෘත්තීය මට්ටම්වල නියුතු පුද්ගලයින් සංවර්ධනය කිරීම සඳහා සාකච්ඡා, සම්මන්ත්‍රණ, වැඩමුළු හා ක්ෂේත්‍ර චාරිකා ආදිය සංවිධානය කරමින් ඔවුන්ගේ දැනුම කුසලතා ආකල්ප ප්‍රවර්ධනය කිරීම.
02. මැද පෙළ කළමනාකරණයේ කුසලතා සංවර්ධනය කිරීම සඳහා සම්මන්ත්‍රණ වැඩමුළු පුහුණු පාඨමාලා හා ක්ෂේත්‍ර චාරිකා සංවිධානය කිරීම මගින් දැනුම කුසලතා ආකල්ප ප්‍රවර්ධනය කිරීම.
03. මෙහෙයුම් කළමනාකරණ මට්ටමේ සෑම ක්ෂේත්‍රයකම සේවකයින්ගේ දැනුම, කුසලතා, හැකියාවන් හා ආකල්ප සංවර්ධනය සඳහා වැඩමුළු හා පුහුණු පාඨමාලා සංවිධානය කිරීම.
04. රාජ්‍ය අංශයේ සමුපකාර නිලධාරීන්ගේ දැනුම කුසලතා හැකියාවන් හා ආකල්ප සංවර්ධනය කිරීම.
05. දූරස්ථ අධ්‍යාපන ක්‍රම භාවිතා කිරීම.

### 2. සමුපකාර සංවිධානවල කාර්ය සාධනය උසස් මට්ටමකට ගෙන ඒම සඳහා දායක වීම

06. සමුපකාර ව්‍යාපාරවල ඵලදායිතාවය හා ගුණාත්මක භාවය උසස් මට්ටමකට ගෙන ඒම
07. උපදේශන සේවාවක් හඳුන්වාදීම හා ක්‍රියාත්මක කිරීම
08. ඉල්ලීම පරිදි දුර්වල ව්‍යාපාර සඳහා සායන (Business Clinic) වසරකට අවම වශයෙන් 2 බැගින් පැවැත්වීම එමගින් දුර්වලතා ඉවත්කර ගැනිමට සහාය වීම

### 3. සමුපකාර ව්‍යාපාරයේ ව්‍යාප්තිය හා පුනර්ජීවය සඳහා පර්යේෂණ හා සංවර්ධන කටයුතුවල යෙදීම

09. සමුපකාර ව්‍යාපාරයේ සාර්ථක අත්දැකීම් හා අසාර්ථක අත්දැකීම් පිළිබඳ පර්යේෂණ කර එමගින් ලැබෙන ඵලදායි ප්‍රතිඵල සමුපකාර ව්‍යාපාරයේ අභිවෘද්ධියට යෙදවීමට මඟපෙන්වීම.
10. සමුපකාර ව්‍යාපාරයේ සාර්ථක අත්දැකීම් පිළිබඳ වාර්තාමය චිත්‍රපට නිෂ්පාදනය කිරීම හා සපයා ගැනීම.
11. ආදර්ශ සමුපකාර ව්‍යවසායයන් ඇතිකිරීමට දායකවීම හා සමුපකාර සංකල්පය තුල කාන්තාව සවිබල ගැන්වීම හා සංවිධානය කිරීම.

### 4. සමුපකාර සංවර්ධනය සඳහා කේන්ද්‍රස්ථානයක් ලෙස ක්‍රියා කිරීම

12. සමස්ථ සමුපකාර ක්ෂේත්‍රය ආවරණය වන පරිදි තොරතුරු පද්ධතියක් හා වෙබ් අඩවියක් නිර්මාණය කිරීම හා පවත්වාගෙන යාම.
13. සමුපකාර ව්‍යාපාරයේ සියළුම ක්ෂේත්‍රයන්ට අදාල වන පරිදි දැනුම ලබාගත හැකි අංග සම්පූර්ණ පුස්තකාල සේවාවක් පවත්වාගෙන යාම.
14. සමුපකාර කෞතුකාගාරයක් (Cooperative Museum) ඇති කිරීම.

### 5. ශ්‍රී ලංකා සමුපකාර ව්‍යාපාරය ස්ථාපිත කිරීම හා ව්‍යාප්ත කිරීම සඳහා සිවිල් සමාජය සවිබල ගැන්වීම

15. සිවිල් සමාජය තුල සමුපකාර දර්ශනය හා භාවිතයන් තහවුරු කිරීමට පියවරයන් ගැනීම.
16. සමුපකාරය පිළිබඳව අධ්‍යාපනික පුවත්පතක් හා වෙනත් ප්‍රකාශන එළිදැක්වීම.

### 6. දේශීය විදේශීය සමුපකාර සංවිධාන සමග අන්තර් සම්බන්ධතා ජාලයක් ගොඩනගා ගැනීම

17. මෙරට සමුපකාර ව්‍යාපාරයේ මුදුන් මට්ටමේ පවතින සමුපකාර සංවිධාන සමග සම්බන්ධතා ජාලයක් ගොඩනගා ගැනීම.
18. ජාත්‍යන්තර සමුපකාර සංධානයෙහි සාමාජිකත්වය තහවුරු කරගැනීම හා අන්තර් සම්බන්ධතා පුළුල් කොට එහි ප්‍රතිලාභ ලබා ගැනීම.
19. ලෝකයේ වෙනත් අදාල සමුපකාර සංවිධාන සමග සම්බන්ධතා ජාලයක් ගොඩනගා ගැනීම.

### 7. රාජ්‍ය අංශය, පෞද්ගලික අංශය හා රාජ්‍ය නොවන අංශයන් සඳහා පහසුකම් ලබා දීම පිණිස ජාතික සමුපකාර සංවර්ධන ආයතනයේ සේවා විවිධාංගීකරණය කිරීම

20. පුද්ගලික අංශය සඳහා අවශ්‍ය වැඩසටහන් හඳුනාගැනීම හා ක්‍රියාත්මක කිරීම.
21. රාජ්‍ය අංශය සඳහා අවශ්‍ය නිෂ්පාදන හඳුනාගැනීම හා ක්‍රියාත්මක කිරීම.
22. රාජ්‍ය නොවන අංශය සඳහා අවශ්‍ය නිෂ්පාදන හඳුනාගැනීම හා ක්‍රියාත්මක කිරීම.

### 8. සමුපකාර ක්ෂේත්‍රයට විශිෂ්ඨ වූ සේවාවක් ලබාදීම සඳහා ජාතික සමුපකාර සංවර්ධන ආයතනයේ කාර්ය සාධනය ඉහළ නැංවීම

23. කාර්ය මණ්ඩලයේ දැනුම, කුසලතා හා ආකල්ප සංවර්ධනය කිරීම.
24. කළමනාකරණ ක්‍රියාවලිය සංවර්ධනය කිරීම.
25. බාහිර ආයතන සඳහා සේවා සැපයීම ගුණාත්මක මට්ටමින් ඉහල නැංවීම.

## ආයතනයේ ප්‍රධාන කාර්යයන්

(අ) සමුපකාර සංවර්ධනයට අදාළ ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය කිරීම සහ සම්බන්ධීකරණය කිරීම සඳහා මධ්‍යස්ථානයක් වශයෙන් ක්‍රියා කිරීම.

(ආ) වෙනත් දේ අතර, නවීන තාක්ෂණික ක්‍රම උපයෝගී කර ගනිමින් සමුපකාර සංවර්ධනය පිළිබඳ පුහුණුව සැපයීම.

(ඇ) සමුපකාර සංවර්ධනය පිළිබඳ පර්යේෂණ ප්‍රවර්ධනය කිරීම.

(ඈ) සමුපකාර සංවර්ධනයට සම්බන්ධ ක්‍රියාකාරකම්වල නියුක්තව සිටින තැනැත්තන් අතර අන්‍යොන්‍ය ක්‍රියාකාරකම් සහ තොරතුරු හුවමාරු කර ගැනීම සඳහා පහසුකම් සැලසීම.

(ඉ) සමුපකාර සංවර්ධනයට අදාල දත්ත රැස් කිරීම අරභයා සම්පත් මධ්‍යස්ථානයක් වශයෙන් ක්‍රියා කිරීම සහ රැස් කරන ලද ඒ දත්ත ප්‍රකාශනය කිරීම මගින් සංචයනය කිරීම හා පතළ කිරීම.

(ඊ) සමුපකාර සංවර්ධනයට අදාළ විෂයයන් සම්බන්ධයෙන් ශාස්ත්‍රීය සහ පුහුණු පාඨමාලා පැවැත්වීම සහ එවැනි පාඨමාලා හදාරා නියමිත විභාගවලින් සමත්වන තැනැත්තන්ට සහතික පත්‍ර සහ වෙනත් ශාස්ත්‍රීය විශිෂ්ටතා පිරි නැමීම.

(උ) කළමනාකරණ නිපුනතා අවශ්‍ය වන සමුපකාර ව්‍යවසායයන් භාර ගෙන කළමනාකරණය කිරීම.

(ඌ) සමුපකාර ව්‍යවසායවලට වෘත්තීය උපදෙස් සැපයීම.

(එ) ආදර්ශ සමුපකාර ගම්මාන, ආදර්ශ සමුපකාර වෙළෙඳ මධ්‍යස්ථාන සහ ප්‍රාදේශීය අලෙවි මධ්‍යස්ථාන පිහිටුවීම.

(ඒ) ආයතනයේ කර්තව්‍යයන්ට සමාන කර්තව්‍ය ඉටු කරන ශ්‍රී ලංකාවේ හෝ ඉන් පිටත පිහිටි සංවිධාන සමග සහයෝගයෙන් කටයුතු කිරීම.

## කළමනාකරණ මණ්ඩලය

ආයතනයේ කළමනාකරණ මණ්ඩලය පහත දැක්වෙන සාමාජිකයන්ගෙන් සමන්විත විය යුතුය.

**(අ) නිල බලයෙන් පත්වන සාමාජිකයන්:**

i. සමුපකාර සංවර්ධන විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා ලෙස, තත් කාලයේ තනතුර දරන්නා හෝ ඔහු විසින් නම් කරනු ලබන තැනැත්තෙකු
ii. සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ සමුපකාර සංවර්ධන කොමසාරිස් හා රෙජිස්ට්‍රාර්
iii. ශ්‍රී ලංකා ජාතික සමුපකාර මණ්ඩලයේ සභාපතිවරයා
iv. පනතේ 16 වන වගන්තිය යටතේ පත් කරනු ලැබූ, ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා

**(ආ) අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන සාමාජිකයන්**

i. සමුපකාර ක්ෂේත්‍රයේ පුළුල් පළපුරුද්දක් සහ කළමනාකරණය පිළිබඳ පළපුරුද්දක් ඇති තැනැත්තන් අතුරින්, සමුපකාර සංවර්ධන විෂය භාර අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන තැනැත්තන් තිදෙනෙක්
ii. උසස් අධ්‍යාපන විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් නම් කරනු ලබන උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ නියෝජිතයෙක්, සහ
iii. මුදල් විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් නම් කරනු ලබන මහා භාණ්ඩාගාරයේ නියෝජිතයෙක්.

ආයතනයේ කටයුතු පරිපාලනය කිරීම, කළමනාකරණය කිරීම සහ පාලනය කිරීම කළමනාකරණ මණ්ඩලයට පැවරෙන්නේය.

ආයතනයේ කටයුතු පරිපාලනය කිරීමේ කාර්යය සඳහා මේ පනතින් ආයතනය වෙත පවරා දී ඇති, පනවා ඇති හෝ භාරකොට ඇති බලතල කාර්ය සහ කර්තව්‍ය කළමනාකරණ මණ්ඩලය විසින් ක්‍රියාත්මක කිරීම සහ ඉටු කිරීම කළ යුතුය.

මෙයට අමතරව ආයතනයේ සම්පත්, අරමුණු හා පරමාර්ථ ලඟා කර ගැනීම සඳහා මෙහෙයවමින් වාර්ෂික සංවර්ධන සැලසුම්, වාර්ෂික අයවැය ලේඛන, ඇගයීම හා අනුමත කිරීම, ප්‍රතිපත්ති සකස් කිරීම, ආයතනයේ කාර්යසාධනය කාලීනව අධීක්ෂණය කිරීම හා ඇගයීම, කාර්තුමය, අර්ධ වාර්ෂික හා වාර්ෂික මූල්‍ය වාර්තා හා විගණකාධිපති වාර්තා විශ්ලේෂණය කිරීම හා ඇගයීම, ප්‍රතිඵල, අපේක්ෂිත ඉලක්ක හා නොසැසඳේ නම් අපේක්ෂිත අරමුණ ලඟා කර ගැනීමට අවශ්‍ය පිළියම් යෙදීම කළමනාකරණ මණ්ඩලයේ වගකීම වන්නේය.

සමාලෝචිත වර්ෂය තුල කළමනාකරණ මණ්ඩලය පහත සඳහන් සාමාජිකයින්ගෙන් සමන්විත විය.

1. සභාපති - නීතීඥ ඒ. එම්. ඒ. ඒ. ලක්මාල් රත්නායක මහතා

2. සාමාජික - ඩබ්. ඒ. ආර්. විමලසිරි මහතා, අධ්‍යක්ෂ ජනරාල්
ජාතික සමුපකාර සංවර්ධන ආයතනය (ශ්‍රී ලංකා පරිපාලන සේවය - I පන්තිය)

3. සාමාජික - ඒ. පී. පී. කිත්සිරි මහතා, අතිරේක ලේකම්, සමුපකාර අංශය, සමුපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යාංශය (2012.09.11 දක්වා)

4. සාමාජික - ඩබ්. එච්. කරුණාරත්න මහතා, සමුපකාර සංවර්ධන කොමසාරිස් හා රෙජිස්ට්‍රාර් (මධ්‍යම රජය) සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව(2012.01.06 සිට)

5. සාමාජික - පී. ටී. ජී. ගුණතිලක මහතා, අතිරේක අධ්‍යක්ෂ ජනරාල්, භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව

6. සාමාජික - එච්. ජේ. ඒ. කල්දේරා මිය, අතිරේක අධ්‍යක්ෂ (සංවර්ධන) උසස් අධ්‍යාපන අමාත්‍යාංශය (2012.02.13 දක්වා)

7. සාමාජික - බන්දුපාල රණවක මහතා, සභාපති, ශ්‍රී ලංකා ජාතික සමුපකාර මණ්ඩලය

8. සාමාජික - කේ. එම්. එම්. ෂාකීර් මහතා, ක්‍රියාකාරී අධ්‍යක්ෂ (සමුපකාර)

9. සාමාජික - ආර්. එම්. ප්‍රේමතිලක රත්නායක මහතා

10. සාමාජික - බි. එම්. එස්. බණ්ඩාර මිය, අධ්‍යක්ෂ (සංවර්ධන), උසස් අධ්‍යාපන අමාත්‍යාංශය. (2012.02.13 වන දින සිට)

11. සාමාජික - එම්. එම්. පී. කේ. මයාදුන්න මහතා, අතිරේක ලේකම් (සැලසුම්, සංවර්ධන හා සමුපකාර), සමුපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යාංශය (2012.09.11 දින සිට)

කළමනාකරණ මණ්ඩල රැස්වීමක් සඳහා ගණපූර්ණය සාමාජිකයන් 5 දෙනෙකුගෙන් සමන්විත විය යුතු අතර, යටත් පිරිසෙයින් මාස 3කට වරක්වත් කළමනාකරණ මණ්ඩල රැස්වීම් පැවැත්විය යුතුය.

සමාලෝචිත වසර තුළ කළමනාකරණ මණ්ඩල රැස්වීම් 08ක් පවත්වා ඇත.

**කළමනාකරණ මණ්ඩල රැස්වීම් සඳහා සහභාගිවීම පිළිබඳ විස්තර 2012**

| නම | රැස්වීම් පැවැත්වූ දින | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | 01/31 | 02/30 | 05/25 | 06/19 | 07/09 | 07/24 | 09/20 | 11/22 |
| 1. ඒ.එම්.ඒ.ඒ. ලක්මාල් රත්නායක මහතා, සභාපති | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ |
| 2. ඩබ්. ඒ. ආර්. විමලසිරි මහතා, අධ්‍යක්ෂ ජනරාල් | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ |
| 3. ඒ. පී. පී. කිත්සිරි මහතා | ✓ | ✓ | ✓ | ab | ab | ab | - | - |
| 4. ඩබ්. එච්. කරුණාරත්න මහතා | ✓ | ✓ | ✓ | ✓ | ab | ✓ | ✓ | ✓ |
| 5. පි. ටී. ජී. ගුණතිලක මහතා | ✓ | ab | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ |
| 6. එච්. ජේ. ඒ. කල්දේරා මහත්මිය | ab | - | - | - | - | - | - | - |
| 7. බන්දුපාල රණවක මහතා | ✓ | ab | ab | ab | ✓ | ab | ab | ab |
| 8. කේ. එම්. එම්. ෂාකීර් මහතා | ab | ✓ | ab | ✓ | ✓ | ✓ | ✓ | ✓ |
| 9. ආර්. එම්. ප්‍රේමතිලක රත්නායක මහතා | ab | ab | ab | ✓ | ✓ | ✓ | ab | ✓ |
| 10. බි. එම්. එස්. බණ්ඩාර මහත්මිය (2012/02/13 වන දින සිට) | - | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ |
| 11. එම්. එම්. පී. කේ. මායාදුන්න මහතා (2012/09/11 වන දින සිට) | - | - | - | - | - | - | ✓ | ✓ |

✓ - කළමනාකරණ මණ්ඩල රැස්වීම් සඳහා සහභාගිත්වය

ab - කළමනාකරණ මණ්ඩල රැස්වීම් සඳහා නොපැමිණීම

- - කළමනාකරණ මණ්ඩල සාමාජිකත්වය නොමැත

## අධ්‍යයන මණ්ඩලය

ආයතනයේ අධ්‍යයන මණ්ඩලය, කළමනාකරණ මණ්ඩලය විසින් පත් කරනු ලබන පහත දැක්වෙන සාමාජිකයන්ගෙන් සමන්විත වේ.

(අ) අධ්‍යයන මණ්ඩලයේ සභාපතිවරයා ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්වරයාය

(ආ) 1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනත මගින් පිහිටුවන ලද විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නම් කරනු ලබන විශ්වවිද්‍යාල අධ්‍යයන කාර්ය මණ්ඩල නියෝජිතයෙක්,

(ඇ) විභාග කොමසාරිස් ජනරාල්වරයා හෝ ඔහුගේ නියෝජිතයෙක්,

(ඈ) සමුපකාර සංවර්ධන කොමසාරිස්වරයා හෝ ඔහු විසින් නම් කරනු ලබන නියෝජිතයෙක්, සහ

(ඉ) අමාත්‍යවරයාගේ මතය අනුව, කළමනාකරණය පිළිබඳ පළපුරුද්ද සහ පුහුණුව ලබා ඇත්තා වූ සමුපකාර අංශයෙන් හෝ පෞද්ගලික අංශයෙන් තෝරා ගනු ලබන තැනැත්තෙකු.

ආයතනයේ පහත සඳහන් කාර්යයන් හා කර්තව්‍යයන් ඉටුකිරීම සඳහා කළමනාකරණ මණ්ඩලය විසින් අධ්‍යයන මණ්ඩලය පත් කරනු ලබන අතර සමාලෝචිත වසර තුළ අධ්‍යයන මණ්ඩලය පහත සඳහන් සාමාජිකයින්ගෙන් සමන්විත විය.

| | | |
|---|---|---|
| 1. ඩබ්. ඒ. ආර්. විමලසිරි මහතා | - | සභාපති<br>අධ්‍යක්ෂ ජනරාල්, (වැඩ බලන) (2012.07.24 දක්වා)<br>ජාතික සමුපකාර සංවර්ධන ආයතනය. |
| 2. ආචාර්ය විජිත නානායක්කාර මහතා | - | සාමාජික,<br>ජ්‍යේෂ්ඨ කථිකාචාර්ය, සමාජ විද්‍යා පීඨය,<br>පේරාදෙණිය විශ්ව විද්‍යාලය,<br>පේරාදෙණිය. |
| 3. ඩබ්. එම්. පී. කේ. වීරසේකර මහතා | - | සාමාජික,<br>සමුපකාර සංවර්ධන කොමසාරිස්, මධ්‍යම පළාත,<br>සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව,<br>මහනුවර. |
| 4. අනුර එදිරිසිංහ මහතා | - | සාමාජික,<br>විභාග කොමසාරිස් ජනරාල්,<br>ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,<br>පැලවත්ත, බත්තරමුල්ල. |
| 5. ඩබ්. ඒ. ආර්. විමලසිරි මහතා | - | ලේඛකාධිකාරි - ලේකම්,<br>ජාතික සමුපකාර සංවර්ධන ආයතනය, පොල්ගොල්ල. |

## අධ්‍යයන මණ්ඩලයේ කාර්යයන්

(අ) ආයතනය සඳහා පුහුණු හා පර්යේෂණ වැඩ සටහන් සකස් කිරීම.

(ආ) ආයතනය විසින් පවත්වාගෙන යනු ලබන පාඨමාලා සඳහා විෂයමාලා සංවර්ධනය කිරීම.

(ඇ) ආයතනය විසින් පවත්වාගෙන යනු ලබන විභාග සඳහා නිර්දේශ පත්‍රිකා සකස් කිරීම සහ අනුමත කිරීම, විභාග අධීක්ෂණය කිරීම සහ ආයතනයේ අධ්‍යාපන පුහුණු වැඩසටහන් ඇගයීමට අදාළ යෝජනා ක්‍රම පිළියෙල කිරීම.

(ඈ) ආයතනය විසින් පවත්වනු ලබන විභාගවල ප්‍රතිඵල කළමනාකරණ මණ්ඩලයේ අනුමැතියට යටත්ව නිකුත් කිරීම සහ,

(ඉ) ශිෂ්‍යත්ව, නිල ලාංඡන සහ වෙනත් ප්‍රදානයන් ප්‍රදානය කිරීමට අදාළ විය යුතු කොන්දේසි නියම කිරීම.

සමාලෝචිත වර්ෂයේ පෙබරවාරි 25 දින අධ්‍යයන මණ්ඩල රැස්වීම පවත්වා ප්‍රතිඵල නිකුත් කිරීමට කටයුතු කර ඇති අතර මෙදින පාඨමාලා 10ක පළමුවර විභාග ප්‍රතිඵල හා ඌනසමත් අපේක්ෂකයන් වෙනුවෙන් පැවැත්වූ නැවත විභාග 04කට අදාල ප්‍රතිඵල සමඟ සම්පූර්ණ ප්‍රතිඵල ලේඛන 14ක් අධ්‍යයන මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලදී. එහි විස්තර පහත පරිදි වේ.

**අ. 2012.02.25 දින පවත්වන ලද අධ්‍යයන මණ්ඩල රැස්වීම**

| පළමුවරට පැවැත්වූ විභාග | | | | | |
|---|---|---|---|---|---|
| **පාඨමාලාව** | **පාඨමාලාව සඳහා සහභාගී වූ සංඛ්‍යාව** | **සමත් සංඛ්‍යාව** | **ඌන සමත් සංඛ්‍යාව** | **අසමත් සංඛ්‍යාව** | **පාඨමාලාව අතහැර ගිය සංඛ්‍යාව** |
| 1. ගණකාධිකරණ ඩිප්ලෝමා පාඨමාලාව (2010/2011) | 21 | 16 | 02 | - | 03 |
| 2. විගණන ඩිප්ලෝමා පාඨමාලාව (2010/2011) | 17 | 14 | - | - | 03 |
| 3. බැංකු කළමනාකරණ ඩිප්ලෝමා පාඨමාලාව (2010/2011) | 28 | 23 | 01 | 03 | 01 |
| 4. ව්‍යාපාර පරිපාලන ඩිප්ලෝමා පාඨමාලාව (2010/2011) | 15 | 15 | - | - | - |
| 5. මානව සම්පත් කළමනාකරණ ඩිප්ලෝමා පාඨමාලාව (2010/2011) | 18 | 14 | 02 | 01 | 01 |
| 6. සමාජ සංවර්ධන ඩිප්ලෝමා පාඨමාලාව (2010) | 17 | 17 | - | - | - |
| 7. සුළු මූල්‍ය කළමනාකරණ ඩිප්ලෝමා පාඨමාලාව (2010/2011) | 08 | 07 | 01 | - | - |
| 8. තොරතුරු තාක්ෂණ ඩිප්ලෝමා පාඨමාලාව (2010/2011) | 24 | 11 | 11 | - | 02 |
| 9. තොරතුරු තාක්ෂණ සහතික පත්‍ර පාඨමාලාව (2011) | 16 | 09 | 04 | - | 03 |
| 10. ඉංග්‍රීසි භාෂා කථනය සහතික පත්‍ර පාඨමාලාව (2011) | 17 | 17 | - | - | - |
| **නැවත පැවැත් වූ විභාග**<br>11. මානව සම්පත් කළමනාකරණ ඩිප්ලෝමා පාඨමාලාව (2008) | 02 | 02 | - | - | - |
| 12. තොරතුරු තාක්ෂණ ඩිප්ලෝමා පාඨමාලාව (2008) | 01 | 01 | - | - | - |
| 13. තොරතුරු තාක්ෂණ ඩිප්ලෝමා පාඨමාලාව (2009/2010) | 03 | 03 | - | - | - |
| 14. තොරතුරු තාක්ෂණ සහතික පත්‍ර පාඨමාලාව (2010) | 14 | 14 | - | - | - |
| **එකතුව** | **201** | **163** | **21** | **04** | **13** |

## කාර්ය මණ්ඩලය

අප ආයතනයේ අනුමත කාර්ය මණ්ඩලය නිලධාරීන් 59 කි. 2012 දෙසැම්බර් 31 දිනට ආයතනය තුල නියුක්ත සේවක සංඛ්‍යාව 31ක් විය. එදිනට පුරප්පාඩු සංඛ්‍යාව 28කි. මෙම පුරප්පාඩු පිරවීම සඳහා අවශ්‍ය මූලික කටයුතු දැනට සම්පාදනය වෙමින් පවතී.

### 2012.12.31 දිනට අනුමත තනතුරු හා සේවක සංඛ්‍යාව පිළිබඳ තොරතුරු

| අනු අංකය | තනතුර | තනතුරු ප්‍රමාණය | සිටින නිලධාරීන් සංඛ්‍යාව | පුරප්පාඩු |
|---|---|---|---|---|
| 1. | අධ්‍යක්ෂ ජනරාල් | 01 | 01 | - |
| 2. | ලේඛකාධිකාරී | 01 | - | 01 |
| 3. | අධ්‍යක්ෂ (අධ්‍යයන හා සංවර්ධන) | 01 | - | 01 |
| 4. | කථිකාචාර්ය | 06 | 03 | 03 |
| 5. | පුස්තකාලයාධිපති | 01 | 01 | - |
| 6. | ජ්‍යේෂ්ඨ කළමනාකරු (මූල්‍ය) | 01 | 01 | - |
| 7. | ජ්‍යේෂ්ඨ කළමනාකරු (මුද්‍රණ) | 01 | - | 01 |
| 8. | නේවාසිකාගාර කළමනාකරු | 01 | - | 01 |
| 9. | සහකාර ලේඛකාධිකාරී | 01 | 01 | - |
| 10. | ව්‍යාප්ති නිලධාරී | 01 | - | 01 |
| 11. | පරිගණක වැඩසටහන් නිලධාරී | 01 | 01 | - |
| 12. | සහකාර කථිකාචාර්ය | 06 | 03 | 03 |
| 13. | සහකාර නේවාසිකාගාර කළමනාකරු | 01 | 01 | - |
| 14. | සහකාර පුස්තකාලයාධිපති | 01 | 01 | - |
| 15. | කළමනාකරණ සේවා සහකාර (උපාධිධාරී) | 12 | 04 | 08 |
| 16. | පරිගණක උපදේශක | 03 | 01 | 02 |
| 17. | පරිගණක වදන් සැකසුම්කරු | 01 | 01 | - |
| 18. | කළමනාකරණ සේවා සහායක | 05 | - | 05 |
| 19. | ඕෆ්සෙට් මුද්‍රණ යන්ත්‍ර ක්‍රියාකරු | 01 | 01 | - |
| 20. | ශ්‍රව්‍ය දෘෂ්‍ය යන්ත්‍ර ක්‍රියාකරු | 01 | 01 | - |
| 21. | සංචාරක බංගලා භාරකරු | 01 | 01 | - |
| 22. | රියදුරු | 04 | 04 | - |
| 23. | සේවා සහායක | 07 | 05 | 02 |
| | **එකතුව** | **59** | **31** | **28** |

## මූල්‍ය ප්‍රගතිය පිළිබඳ තොරතුරු

ජාතික සමුපකාර සංවර්ධන ආයතනයේ පසුගිය වසර 5ක කාල පරිච්ඡේදය සම්බන්ධව ආදායම්, වියදම්, භාණ්ඩාගාර ප්‍රදාන සංක්ෂිප්තව පහත පරිදි වේ.

### 2008 - 2012 වර්ෂය දක්වා ආදායම

| විස්තරය | 2008 | 2009 | 2010 | 2011 | 2012 |
|---|---|---|---|---|---|
| 1. පාඨමාලා ගාස්තු | 5,999,038 | 5,594,102 | 8,320,364 | 7,889,115 | 15,953,198 |
| 2. නේවාසිකාගාර, දේශන ශාලා හා නිල නිවාස හා ගොඩනැගිලි කුලී | 6,390,476 | 6,130,260 | 6,543,381 | 8,057,757 | 10,851,292 |
| 3. සේවා ගාස්තු | 1,730,750 | 1,158,914 | - | - | - |
| 4. ආහාර සැපයීම් මත කොමිස් හා සේවා ගාස්තු | 1,284,315 | 972,492 | 805,864 | 999,972 | 1,145,887 |
| 5. මුද්‍රණ සේවා හා ප්‍රකාශන අලෙවි ගාස්තු | 155,285 | 387,932 | 395,727 | 405,768 | 301,200 |
| 6. කාර්යසාධන තරගාවලිය සඳහා ලියාපදිංචි ගාස්තු | - | - | 1,225,600 | - | - |
| 7. ස්ථාවර වත්කම් විකුණුම් ආදායම | - | - | 1,144,039 | 1,060,830 | 34,650 |
| 6. වෙනත් ආදායම් | 1,692,359 | 1,607,621 | 2,209,656 | 3,007,189 | 3,295,694 |
| **මුළු එකතුව** | **17,252,223** | **15,851,319** | **20,644,631** | **21,420,631** | **31,581,921** |




2012 වර්ෂයේදී ජාතික සමුපකාර සංවර්ධන ආයතන ආදායම රුපියල් මිලියන 31.58ක් වන අතර එම ආදායම අංශ අනුව පහත පරිදි දැක්විය හැක.



## 2008 - 2012 වර්ෂය දක්වා වියදම

| විස්තරය | 2008 | 2009 | 2010 | 2011 | 2012 |
|---|---|---|---|---|---|
| 1. වැටුප් හා වේතන, දේශන ගාස්තු, අනෙකුත් ගාස්තු | 17,535,359 | 18,445,338 | 19,512,564 | 20,323,326 | 24,989,993 |
| 2. ගමන් වියදම් | 542,174 | 623,357 | 753,427 | 1,503,396 | 1,583,574 |
| 3. සැපයුම් හා කාර්යාලීය අවශ්‍යතා | 3,775,773 | 2,896,742 | 3,902,331 | 4,020,919 | 6,651,487 |
| 4. නඩත්තු වියදම් | 1,838,114 | 1,686,323 | 2,405,953 | 3,125,426 | 3,340,968 |
| 5. ගිවිසුම්ගත සේවා | 8,130,603 | 8,969,645 | 9,206,898 | 12,751,894 | 16,564,579 |
| 6. අනෙකුත් | 622,995 | 1,513,243 | - | - | 919,182 |
| අ) කාර්ය සාධන තරගාවලිය සඳහා වු වියදම් | - | - | 2,458,531 | - | - |
| ආ) ජාතිය ගොඩනැගීමේ බදු | - | - | 829,082 | 429,394 | - |
| ඇ) විවිධ වියදම් | - | - | 967,970 | 733,302 | - |
| **මුළු වියදම** | **32,445,018** | **34,134,648** | **40,036,756** | **42,887,657** | **54,049,783** |




## 2008 - 2012 කාලය තුල භාණ්ඩාගාරයෙන් ලද ප්‍රතිපාදන

| විස්තරය | 2008 රු. | 2009 රු. | 2010 රු. | 2011 රු. | 2012 රු. |
|---|---|---|---|---|---|
| ප්‍රාග්ධන ප්‍රතිපාදන | 19,500,000 | 49,400,000 | 70,200,000 | 2,000,000 | 27,597,956 |
| පුනරාවර්තන ප්‍රතිපාදන | 19,680,000 | 21,470,211 | 22,390,000 | 22,743,582 | 18,262,259 |

## 2008-2012 වර්ෂය තුල ආයතනික ඉපයීම්, වියදම් හා ප්‍රතිපාදන

| විස්තරය | 2008 | 2009 | 2010 | 2011 | 2012 |
|---|---|---|---|---|---|
| 1. ආයතනික ඉපයීම් | 17,252,222 | 15,851,319 | 20,644,631 | 21,420,631 | 31,581,921 |
| 2. වියදම | 32,445,018 | 34,134,648 | 40,036,756 | 42,887,657 | 54,049,783 |
| ප්‍රතිපාදනවලට පෙර ඌනතාවය | (15,192,795) | (18,283,329) | (19,392,125) | (21,467,026) | (22,467,862) |
| 3. පුනරාවර්තන ප්‍රතිපාදන(භාණ්ඩාගාර ප්‍රතිපාදන හා මහජන බැංකු ආධාර) | 19,680,000 | 21,470,211 | 22,390,000 | 22,743,582 | 18,262,259 |
| ප්‍රතිපාදනවලින් පසුව (ඌනතාවය) අතිරික්තය | 4,487,205 | 3,186,882 | 2,997,875 | 1,276,556 | (4,205,603) |

## 2008-2012 වර්ෂය තුල ලද භාණ්ඩාගාර ප්‍රාග්ධන ප්‍රතිපාදන හා ලැබීම් හා යෙදවීම

| විස්තරය | 2008 | 2009 | 2010 | 2011 | 2012 |
|---|---|---|---|---|---|
| ප්‍රාග්ධන ප්‍රදාන පෙර වර්ෂයෙන් ඉදිරියට ගෙන ආ ශේෂය | 1,060,354 | - | 10,484,405 | 31,521,228 | 27,404,196 |
| ප්‍රාග්ධන ප්‍රතිපාදන ලැබීම් | 19,500,000 | 49,400,000 | 70,200,000 | 2,000,000 | 1,000,000 |
| **මුළු ප්‍රාග්ධන ප්‍රතිපාදන මුදල්** | **20,560,354** | **49,400,000** | **80,684,405** | **33,521,228** | **28,404,196** |
| **ප්‍රාග්ධන ප්‍රදාන යෙදවීම්** | | | | | |
| (අ) නිවාස නිකේතනය, මුළු තැන්ගෙය භෝජනාගාරය, දේශනශාලා කාර්යාල පද්ධතිය, නේවාසිකාගාර වැඩි දියුණු කිරීම | 7,268,108 | - | - | - | - |
| (ආ) බහුකාර්ය ගොඩනැගිල්ල දෙවන අදියර හා අවසන් අදියර ඉදිකිරීම | 10,632,028 | 9,242,800 | 2,178,133 | 46,500 | 180,462 |
| (ඇ) ආයතනයේ ගොඩනැගිල්ල සඳහා විදුලි රැහැන් ඇද විදුලිය සැපයීම | - | - | - | - | - |
| (ඈ) බහුකාර්ය ගොඩනැගිල්ලට හා ශ්‍රවනාගාර ගොඩනැගිල්ලට විදුලිය සැපයීම සඳහා ට්‍රාන්ස්පෝමරය සවිකිරීම | - | 2,272,795 | - | - | - |
| (ඉ) ලී බඩු කාර්යාල උපකරණ පරිගණක යන්ත්‍ර මිලදී ගැනීම | 1,036,758 | 1,000,000 | 8,374,044 | 725,956 | - |
| (ඊ) ශ්‍රවනාගාර ගොඩනැගිල්ල ඉදිකිරීම | 344,484 | 26,400,000 | 38,611,000 | 5,344,576 | 25,891,456 |
| (උ) ආයතන භූමියේ මාර්ග පද්ධතිය සංවර්ධනය කිරීම හා භූමිය වටා වැටක් ඉදිකිරීම | 1,278,976 | - | - | - | - |
| **මුළු වියදම** | **20,560,354** | **389,915,595** | **49,163,177** | **6,117,032** | **26,071,918** |
| ඉදිරියට ගෙන ගිය ඉතිරි මුදල | - | 10,484,405 | 31,521,228 | 27,404,196 | **2,332,278** |

## අධ්‍යයන කටයුතු පිළිබඳ තොරතුරු

### ආයතනය මගින් සංවිධානය කළ පාඨමාලා පිළිබඳ ප්‍රගතිය 2008 - 2012

| පාඨමාලා | 2008 | | 2009 | | 2010 | | 2011 | | 2012 | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | පාඨමාලා සංඛ්‍යාව | සහභාගි වූ සංඛ්‍යාව | පාඨමාලා සංඛ්‍යාව | සහභාගි වූ සංඛ්‍යාව | පාඨමාලා සංඛ්‍යාව | පාඨමාලා සංඛ්‍යාව | පාඨමාලා සංඛ්‍යාව | සහභාගි වූ සංඛ්‍යාව | පාඨමාලා සංඛ්‍යාව | සහභාගි වූ සංඛ්‍යාව |
| ඩිප්ලෝමා | 07 | 124 | 02 | 55 | 08 | 142 | 09 | 181 | 08 | 212 |
| සහතික පත්‍ර | 03 | 103 | 04 | 124 | 05 | 156 | 05 | 97 | 09 | 205 |
| කෙටිකාලීන | 36 | 1051 | 37 | 1331 | 64 | 2738 | 36 | 1413 | 57 | 2062 |
| වෘත්තීය විභාග සඳහා සිසුන් පුහුණු කිරීම | - | - | - | - | - | - | 04 | 47 | 12 | 220 |
| **එකතුව** | **46** | **1278** | **43** | **1510** | **77** | **3036** | **54** | **1738** | **86** | **2699** |




පෙර වර්ෂ හා සැසඳීමේදී සමාලෝචිත වසර තුළ ආයතනය මගින් සංවිධානය කරන ලද ඩිප්ලෝමා පාඨමාලා, සහතික පත්‍ර පාඨමාලාවල හා කෙටිකාලීන කළමනාකරණ සංවර්ධන වැඩසටහන්වල සාපේක්ෂව ඉහළයාමක් පෙන්නුම් කර ඇත. මේ සඳහා ප්‍රබල ලෙස බලපා ඇත්තේ සමුපකාර ව්‍යාපාරයේ අවශ්‍යතාවයන් හඳුනාගෙන ඒ අනුව පුහුණු වැඩසටහන් නිර්මාණය කිරීමට ආයතනය කටයුතු කිරීමයි.

## බාහිර ආයතනවල ඉල්ලීම් අනුව සංවිධානය කරන ලද පාඨමාලා 2008 - 2012

| වර්ෂය | 2008 | 2009 | 2010 | 2011 | 2012 |
|---|---|---|---|---|---|
| පවත්වන ලද පාඨමාලා සංඛ්‍යාව | 368 | 329 | 255 | 329 | 570 |
| සහභාගි වූ මුළු සංඛ්‍යාව | 21439 | 16715 | 19852 | 16955 | 27475 |

ආයතනයේ භෞතික සම්පත් සංවර්ධනය මෙන්ම පරිපාලනමය සංශෝධන තුළින් බාහිර පාර්ශවයන් තෘප්තිමත් කිරීම සඳහා අවශ්‍ය කටයුතු සම්පාදනය කරන ලදි. මේ නිසා පසුගිය වර්ෂ කිහිපය තුළ අප ආයතනයේ පුහුණු පහසුකම් අපේක්ෂාවෙන් පැමිණි ආයතනවල කැපී පෙනෙන වර්ධනයක් අත්කර ගැනීමට හැකි වී ඇත.

## 1. මානව සම්පත් සංවර්ධනය

ආයතනයේ ප්‍රමුඛතම කාර්ය වනුයේ සමුපකාර ව්‍යාපාරයේ මානව සම්පත සංවර්ධනය කිරීමයි. මෙම අරමුණ මුල් කොටගෙන සමාලෝචිත වසර තුල සමුපකාර අංශයේ මෙන්ම රාජ්‍ය අංශයේ නිලධාරින් පුහුණු කිරීම සඳහා ඩිප්ලෝමා පාඨමාලා, සහතික පත්‍ර පාඨමාලා හා විෂයානු බද්ධ කෙටිකාලීන කළමනාකරණ පුහුණු වැඩසටහන් රාශියක් ක්‍රියාත්මක කරන ලදී.

## 1.1 සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තු නිලධාරි පුහුණුව

### (අ) සමුපකාර සංවර්ධනය පිළිබඳ උසස් ඩිප්ලෝමා පාඨමාලාව

මෙම පාඨමාලාව සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවට බඳවා ගනු ලබන සමුපකාර සංවර්ධන නිලධාරින්ගේ කඩඉම් පරීක්ෂණයක් ලෙස පැවැත්වෙන ඩිප්ලෝමා පාඨමාලාවකි. දිවයිනේ විවිධ පළාත්වල සමුපකාර සංවර්ධනය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව අවසන් කළ සමුපකාර සංවර්ධන නිලධාරින් මෙම ඩිප්ලෝමා පාඨමාලාව හැදෑරීම සඳහා සුදුසුකම් ලබති. 2012 වර්ෂයේ මාර්තු 05 දින මෙම පාඨමාලාව සඳහා පහත දැක්වෙන පරිදි දිවයිනේ විවිධ පළාත්වලින් සමුපකාර සංවර්ධන නිලධාරින් 90 දෙනෙකු බඳවා ගෙන අධ්‍යයන කටයුතු සිදු කර සියළු විභාග පවත්වා සමාලෝචිත වසරේ නොවැම්බර් මාසයේදී පාඨමාලාව සාර්ථකව නිම කරන ලදී.

2012 වර්ෂය තුළ සිදුකළ සමුපකාර සංවර්ධන නිලධාරින් පුහුණුව

| පාඨමාලාව | ආරම්භ කළ දිනය | අවසන් කළ දිනය | පුහුණුලාභීන් සංඛ්‍යාව |
|---|---|---|---|
| 1. සමුපකාර සංවර්ධන ඩිප්ලෝමා පාඨමාලාව දකුණු පළාත් සමුපකාර සංවර්ධන නිලධාරින් සඳහා | 2012.03.05 | 2012.11.15 | 42 |
| 2. සමුපකාර සංවර්ධන ඩිප්ලෝමා පාඨමාලාව (බස්නාහිර, නැගෙනහිර හා වයඹ පළාත් සමුපකාර සංවර්ධන නිලධාරින් සඳහා | 2012.03.05 | 2012.11.15 | 48 |
| **එකතුව** | | | **90** |

සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ සමුපකාර සංවර්ධන නිලධාරින් සඳහා පවත්වන උසස් ඩිප්ලෝමා පාඨමාලා හා පුහුණුලාභීන් පිළිබද සංක්ෂිප්ත විස්තරයක් පහත දැක්වේ.

| වර්ෂය | පාඨමාලා සංඛ්‍යාව | සහභාගි වූ මුළු සංඛ්‍යාව |
|---|---|---|
| 2007 | 01 | 41 |
| 2008 | 01 | 9 |
| 2011 | 01 | 26 |
| 2012 | 02 | 90 |
| **මුළු සංඛ්‍යාව** | **05** | **166** |

2009 හා 2010 වර්ෂවල මෙම පාඨමාලාව අලුතින් ආරම්භ කර නොමැත

**(ආ) සමුපකාර සංවර්ධනය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව**

මෙම පාඨමාලාව සමුපකාර සංවර්ධන නිලධාරින්ගේ පළමු කාර්යක්ෂමතා කඩඉම සම්පූර්ණ කිරීම හා සේවය ස්ථිර කිරීම සඳහා සුදුසුකම් සපුරාලීම වෙනුවෙන් පැවැත්වෙන පාඨමාලාවකි. සමාලෝචිත වසර තුළ සමුපකාරය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලා 02ක දෙවන වාරයේ අධ්‍යයන කටයුතු හා ඊට අදාල සියලු විභාග පවත්වා පාඨමාලා සාර්ථකව අවසන් කරන ලදී. එහි විස්තර පහත පරිදි වේ.

| පාඨමාලාව | ආරම්භ කළ දිනය | අවසන් කළ දිනය | පුහුණුලාභීන් සංඛ්‍යාව |
|---|---|---|---|
| 1. සමුපකාර සංවර්ධනය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව (සබරගමුව හා උතුරු පළාත් සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සඳහා පළමු වාරය ආරම්භය 2010.11.01) දෙවන වාරය අධ්‍යයන කටයුතු | 2011.09.03 | 2012.04.06 | 51 |
| 2. සමුපකාර සංවර්ධනය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව (දකුණු පළාත් සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සඳහා) දෙවන වාරය අධ්‍යයන කටයුතු (පළමුවාරය ආරම්භය 2011.03.05) | 2011.10.08 | 2012.02.15 | 30 |
| **එකතුව** | | | **81** |

2008 වර්ෂයේ සිට 2012 වර්ෂය දක්වා මෙම ආයතනය මගින් පවත්වන ලද සමුපකාර සංවර්ධනය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලා පිළිබඳ සංක්ෂිප්ත විස්තරයක් පහතින් සඳහන් කරමි.

| වර්ෂය | විස්තරය | |
|---|---|---|
| | පාඨමාලා සංඛ්‍යාව | සහභාගි වූ මුළු සංඛ්‍යාව |
| 2008 | සහතික පත්‍ර පාඨමාලා පවත්වා නැත | |
| 2009 | 02 | 95 |
| 2010 | 01 | 51 |
| 2011 | 01 | 30 |
| 2012 | මෙම වර්ෂයේ ආරම්භ කර නොමැත | |

## 1.2 සමුපකාරය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලා

මෙම පාඨමාලාව සමුපකාර ව්‍යාපාරයේ වෘත්තිකයන්ගේ හා සේවකයන්ගේ දැනුම හා කුසලතාවය වැඩි දියුණු කිරීම සඳහා පවත්වනු ලබන එක් අවුරුදු අර්ධ කාලීන ඩිප්ලෝමා පාඨමාලාවකි.

සමාලෝචිත වසර තුල ඩිප්ලෝමා පාඨමාලා 05ක් ආරම්භ කරන ලද අතර එමගින් සිසුන් 97 දෙනෙකුට දැනුම හා පුහුණුව ලබා දෙන ලදී.

එයට අමතරව 2011 වර්ෂයේදී ආරම්භ කරන ලද එවැනි ඩිප්ලෝමා පාඨමාලා 06ක අධ්‍යයන කටයුතු සමාලෝචිත වසරේදී අවසන් කරන ලදී.

2012 වර්ෂයේදී ආරම්භ කරන ලද ඩිප්ලෝමා පාඨමාලාවල විස්තර පහත පරිදි වේ.

| පුහුණු පාඨමාලාව | ආරම්භක දිනය | අවසන් කළ/අවසන් කිරීමට නියමිත දිනය | සහභාගි වු සංඛ්‍යාව |
|---|---|---|---|
| 1. විගණන ඩිප්ලෝමා පාඨමාලාව 2012/2013 | 2012.12.17 | 2013 නොවැම්බර් | 14 |
| 2. බැංකු කළමනාකරණ ඩිප්ලෝමා පාඨමාලාව 2012/2013 | 2012.12.17 | 2013 නොවැම්බර් | 26 |
| 3. ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව 2012/2013 | 2012.12.17 | 2013 නොවැම්බර් | 20 |
| 4. මානව සම්පත් කළමනාකරණ ඩිප්ලෝමා පාඨමාලාව 2012/2013 | 2012.12.17 | 2013 නොවැම්බර් | 24 |
| 5. ගණකාධිකරණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව 2012/2013 | 2012.12.17 | 2013 නොවැම්බර් | 13 |
| **එකතුව** | | | **97** |

2007 වර්ෂයේ සිට 2012 වර්ෂය දක්වා මෙම ආයතනය මගින් පවත්වන ලද ඩිප්ලෝමා පාඨමාලා සංඛ්‍යාව හා පුහුණුලාභීන් සංඛ්‍යාව පිළිබඳ සංක්ෂිප්ත සටහනක් පහත දැක්වේ.

| වර්ෂය | විස්තරය | |
|---|---|---|
| | පාඨමාලා සංඛ්‍යාව | සහභාගි වු මුළු සංඛ්‍යාව |
| 2007 | 04 | 85 |
| 2008 | 05 | 93 |
| 2009 | 01 | 21 |
| 2010 | 07 | 119 |
| 2011 | 06 | 121 |
| 2012 | 05 | 97 |
| **එකතුව** | **28** | **536** |




## 1.3 සමුපකාරය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලා

සමුපකාර සමිතිවල මධ්‍ය කළමනාකරණ සේවාවන්හි නිරත වූවන්ගේ වෘත්තීය කුසලතාවය වර්ධනය කිරීම අරමුණු කරගෙන මෙම පාඨමාලාව සැලසුම් කර ඇත.

සමාලෝචිත වසර තුල සහතික පත්‍ර පාඨමාලා 02ක් ආරම්භ කර පුහුණුලාභීන් 73 දෙනෙකු පුහුණු කරන ලදී.

එයට අමතරව 2011 වර්ෂයේ සැප්තැම්බර් මස ආරම්භ කරන ලද බැංකු හා මූල්‍ය කළමනාකරණ සහතික පත්‍ර පාඨමාලාවට අදාල සියලු විභාග මෙම වසරේදී පවත්වා සාර්ථකව එම පාඨමාලාව අවසන් කරන ලදී.

2012 වර්ෂයේදී ආරම්භ කරන ලද සහතික පත්‍ර පාඨමාලාව පිළිබඳ විස්තර පහත පරිදි වේ.

| පුහුණු පාඨමාලාව | ආරම්භක දිනය | අවසන් කළ/අවසන් කිරීමට නියමිත දිනය | සහභාගි වූ සංඛ්‍යාව |
|---|---|---|---|
| 1. බැංකු හා මූල්‍ය කළමනාකරණ සහතික පත්‍ර පාඨමාලාව | 2012.08.25 | 2013.03. | 35 |
| 2. රැකියාභිමුඛ වෘත්තීය කළමනාකරණ කුසලතා සංවර්ධන සහතික පත්‍ර පාඨමාලාව | 2012.12.20 | 2013.05. | 38 |
| **එකතුව** | | | **73** |

2007 වර්ෂයේ සිට 2012 වර්ෂය දක්වා මෙම ආයතනය මගින් පවත්වන ලද සමුපකාර සහතික පත්‍ර පාඨමාලා හා පුහුණුලාභීන් සංඛ්‍යාව පිළිබඳ සංක්ෂිප්ත සටහනක් පහත දැක්වේ.

| වර්ෂය | විස්තරය | |
|---|---|---|
| | පාඨමාලා සංඛ්‍යාව | සහභාගි වූ මුළු සංඛ්‍යාව |
| 2007 | 02 | 26 |
| 2008 | 01 | 27 |
| 2009 | 01 | 22 |
| 2010 | 02 | 49 |
| 2011 | 01 | 15 |
| 2012 | 02 | 73 |




## 1.4 විෂයානුබද්ධ කෙටිකාලීන කළමනාකරණ පුහුණු වැඩසටහන්

වාර්ෂිකව මෙම ආයතනය විසින් සමුපකාර ක්ෂේත්‍රයේ නියුතු සමුපකාර සමිති නායකයින්, සේවකයින් හා සමුපකාර දෙපාර්තමේන්තුවලට අනුයුක්ත නිලධාරීන් මෙන්ම රාජ්‍ය අංශයේ සේවකයින් ඉලක්ක කරගෙන විවිධ ක්ෂේත්‍රයන්ට අදාලව කෙටිකාලීන කළමනාකරණ හා නිපුණතා සංවර්ධන පුහුණු වැඩසටහන් රැසක් සංවිධානය කරනු ලැබේ.

සමාලෝචිත වර්ෂය තුලදී මෙම ආයතනය විසින් සමුපකාර සංවිධානවල සියලුම මට්ටම්වල සේවකයින් නියෝජනය වන පරිදි කෙටිකාලීන කළමනාකරණ පුහුණු වැඩසටහන් 15ක් සැලසුම්කර ක්‍රියාත්මක කරන ලදී.

එයට අමතරව සමුපකාර සංවිධානවල ඉල්ලීම පරිදි විශේෂ කෙටිකාලීන කළමනාකරණ පුහුණු වැඩසටහන් 19ක් ක්‍රියාත්මක කළ අතර මහජන බැංකු ආධාර උපයෝගී කරමින් උතුරු හා නැගෙනහිර පළාත්වල මෙන්ම අනෙකුත් ප්‍රදේශවල තෝරාගත් සමුපකාර සංවිධානවල නායකයින්ගේ මෙන්ම සේවකයින්ගේ දැනුම හා කුසලතාවය වර්ධනය කිරීම හා සමුපකාර සංවිධානවල ඵලදායිතාවය වර්ධනය කිරීම අරමුණු කරගෙන කෙටිකාලීන කළමනාකරණ පුහුණු වැඩසටහන් 23ක් සැලසුම්කර ක්‍රියාත්මක කිරීමට හැකිවිය.

## පුහුණු මාර්ගෝපදේශය අනුව පැවැත්වූ කෙටිකාලීන පුහුණු වැඩසටහන් – 2012

| | කෙටිකාලීන පාඨමාලා | පැවැත්වූ දිනය | පුහුණුලාභීන් ගණන |
|---|---|---|---|
| 1. | ලේකම් පරිචය පුහුණු වැඩසටහන | 2012 .03. 04 - 06 | 32 |
| 2. | පිරිස්බල තක්සේරු සකස් කිරීම පිළිබඳ පාඨමාලාව | 2012.06.08,09,10 | 29 |
| 3. | ප්‍රාදේශික කළමනාකරුවන් හා තොග කළමනාකරුවන් දැනුවත් කිරීමේ පුහුණු වැඩමුළුව | 2012.06.23-24 | 22 |
| 4. | Office Automation | 2012.07.21 | 17 |
| 5. | ග්‍රාමීය බැංකු ලිපිකරුවන්ගේ කුසලතා සංවර්ධන වැඩසටහන | 2012.08.03 - 05 | 34 |
| 6. | උපායශීලී විකුණුම් ක්‍රම හා පාරිභෝගික සත්කාරය | 2012.08.04 - 05 | 36 |
| 7. | ග්‍රාමීය බැංකු කළමනාකරුවන්ගේ කුසලතා සංවර්ධන වැඩසටහන | 2012.08.10 - 12 | 34 |
| 8. | අභ්‍යන්තර විගණනය | 2012.08.28-09.01 | 19 |
| 9. | ලංකා ගිණුම්කරණ ප්‍රමිත භාවිතය පිළිබඳ කුසලතා වර්ධන පුහුණු වැඩසටහන | 2012.09.24-26 | 26 |
| 10. | කෝප්සිටි වෙළඳසැල් සච්බල ගැන්වීම සඳහා උපාය මාර්ගික අලෙවිකරණ වැඩමුළුව | 2012.10.18-19 | 15 |
| 11. | තිරසාර මූල්‍ය ආයතනයක ණය කළමනාකරණය පිළිබඳ වැඩමුළුව | 2012.10.20-21 | 53 |
| 12. | නිර්මානශීලී සමුපකාර කළමනාකරණය සඳහා අධ්‍යක්ෂ මණ්ඩල පුහුණුව | 2012.10.22-23 | 35 |
| 13. | ග්‍රාමීය බැංකු ක්ෂේත්‍ර නිලධාරීන් සඳහා පාරිභෝගික සංවර්ධන කළමනාකරණය පිළිබඳ පාඨමාලාව | 2012.11.02-04 | 47 |
| 14. | සමුපකාර සමිතිවල සාමාන්‍යාධිකාරිවරුන්ගේ වෘත්තීය කළමනාකරණ කුසලතා සංවර්ධනය පාඨමාලාව | 2012.11.11-12 | 20 |
| 15. | සමුපකාර පළාත් අමාත්‍යවරුන් හා පළාත් ලේකම්වරුන් හා පළාත් කොමසාරිස්වරුන්ගේ භූමිකා සංවර්ධනය පිළිබඳ වැඩමුළුව | 2012.11.16-17 | 29 |
| | **එකතුව** | | **448** |

| වර්ෂය | විස්තරය | |
|---|---|---|
| | පාඨමාලා සංඛ්‍යාව | සහභාගී වූ මුළු සංඛ්‍යාව |
| 2008 | 36 | 1051 |
| 2009 | 37 | 1331 |
| 2010 | 64 | 2738 |
| 2011 | 36 | 1413 |
| 2012 | 57 | 2062 |

ඒ අතර මෙම ආයතනය විසින්ම සැලසුම් කළ වැඩසටහන් මෙන්ම විවිධ සමුපකාර සංවිධානවල ඉල්ලීම හා අවශ්‍යතාවය ද පදනම් කොටගෙන මෙම පුහුණු පාඨමාලා සංවිධානය කරනු ලැබේ. ඒ අනුව සමාලෝචිත වසර තුළ පහත සඳහන් පරිදි අදාළ පුහුණු වැඩසටහන් සංවිධානය කරන ලදී.

**<u>බාහිර ඉල්ලීම් මත පවත්වන ලද පුහුණු වැඩසටහන්</u>**

| | **කෙටිකාලීන පාඨමාලා** | **පැවැත්වූ දින** | **සහභාගීත්වය** |
|---|---|---|---|
| 1. | 2012 දැයට කිරුළ ජාතික වැඩසටහනට සමගාමීව අනුරාධපුර දිස්ත්‍රික්කයේ විවිධ සේවා සමුපකාර සමිතිවල ග්‍රාමීය බැංකු කළමනාකරුවන් හා ලිපිකරුවන්ගේ ආකල්ප සංවර්ධන වැඩසටහන | 2012.01.12 - 13 | 80 |
| 2. | දකුණු පළාත් සමුපකාර සමිති සාමාජිකයින්ගේ දූ දරුවන් සමුපකාර ව්‍යාපාරය පිළිබඳව දැනුවත් කිරීමේ පුහුණු වැඩමුළුව | 2012.01.17 - 19 | 37 |
| 3. | 2012 දැයට කිරුළ ජාතික වැඩසටහනට සමගාමී අනුරාධපුර දිස්ත්‍රික්කයේ විවිධ සේවා සමුපකාර සමිතිවල කාර්යමණ්ඩල සාමාජිකයින්ගේ ආකල්ප සංවර්ධන වැඩසටහන | 2012.01.19 | 62 |
| 4. | අනුරාධපුර දිස්ත්‍රික්කයේ ග්‍රාමීය බැංකු කළමනාකරුවන්ගේ කාර්යාභිවර්ධන පුහුණු වැඩසටහන | 2012.02.20 | 64 |
| 5. | සී/ස තැපැල් හා ටෙලිකොම් සේවක සමුපකාර බැංකු සමිතියේ අධ්‍යක්‍ෂ මණ්ඩල හා කාර්ය මණ්ඩල පුහුණු වැඩසටහන | 2012.03.03-04 | 40 |
| 6. | අනුරාධපුර දිස්ත්‍රික්කයේ සමුපකාර සංවර්ධන නිලධාරීන් සහ විවිධ සේවා සමුපකාර සමිතිවල මානව සම්පත් කළමනාකරුවන් සඳහා ආකල්ප සංවර්ධන වැඩසටහන | 2012.03.08 | 60 |
| 7. | ලංකා කෝප්නෙට් ව්‍යාපෘතියේ පුහුණු වැඩසටහන - (TOT) | 2012.03.22 | 15 |
| 8. | මාතර දිස්ත්‍රික් සණස සංගමයේ ලේකම්වරුන්ගේ පුහුණු වැඩසටහන | 2012.03.23 - 24 | 36 |
| 9. | මාතර දිස්ත්‍රික් සණස සංගමයේ කාර්යමණ්ඩල පුහුණුව | 2012.05.26<br>2012.05.29 | |
| 10. | ලංකා කෝප්නෙට් ව්‍යාපෘතියේ පුහුණු වැඩසටහන - මෙහෙයුම් මට්ටම | 2012.04.21-30 | 50 |
| 11. | අනුරාධපුර දිස්ත්‍රික්කයේ සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ සමුපකාර සංවර්ධන නිලධාරීන් සහ විසේස සමිතිවල මානව සම්පත් කළමනාකරුවන් සඳහා පිරිස්බල තක්සේරු සකස් කිරීමේ වැඩසටහන | 2012.04.26 සිට<br>2012.04.27 | 70 |
| 12. | දැයට කිරුළ වැඩසටහන යටතේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ විවිධසේවා සමුපකාර සමිතිවල අධ්‍යක්‍ෂ මණ්ඩල පුහුණුව | 2012.06.21 | 26 |
| 13. | බදුල්ල වි.සේ.ස.සමිතියේ ග්‍රාමීය බැංකු අංශයේ නිලධාරි පුහුණුව | 2012.06.23-<br>2012.06.25 | 16 |
| 14. | අනුරාධපුර දිස්ත්‍රික්කයේ විවිධ සේවා සමුපකාර සමිතිවල ග්‍රාමීය බැංකු කළමනාකරුවන්ගේ පුහුණු වැඩසටහන | 2012.06.28-29 | 81 |
| 15. | අනුරාධපුර හා පොළොන්නරුව දිස්ත්‍රික්කවල සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවල නිලධාරීන් සඳහා විධිමත් 46/1 පරීක්‍ෂණ පැවැත්වීමේ ප්‍රායෝගික භාවිතය | 2012.07.23-24 | 70 |
| 16. | අනුරාධපුර දිස්ත්‍රික්කයේ විවිධ සේවා සමුපකාර සමිතිවල අධ්‍යක්‍ෂ මණ්ඩල පුහුණුව | 2012.07.28-29 | 50 |
| 17. | මහවැලි ගොවි සංවිධාන - සැප්තැම්බර් 28 - ඔක්තෝම්බර් 02 | 2012.09.28<br>2012.10.02 | 42 |
| 18. | සමුපකාර සංවර්ධන උප කොමසාරිස් කාර්යාලවල සේවය කරන අධ්‍යාපන නිලධාරීන් සඳහා මෙහෙයුම් වාර්තා විශ්ලේෂණ වැඩමුළුව | 2012.11.29 | 24 |
| 19. | මහවැලි ගොවි සංවිධාන විගණන නිලධාරි පුහුණුව 2012 දෙසැම්බර් 09-10 | 2012.12.09-10 | 27 |
| 315 මිලදී ගැනීම් - අනෙකුත් විකුණුම් භාණ්ඩ | | | 32,500 |
| | **4,020,912** | **4,020,912** | **6,651,487** |

සටහන - 18

| නඩත්තු වියදම් (කේත අංක :04) | | | |
|---|---|---|---|
| 401 රථවාහන | 1,467,809 | 1,467,809 | 1,160,589 |
| 402 යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ | 541,314 | 541,314 | 822,239 |
| 403 ගොඩනැගිලි | 1,002,855 | 1,002,855 | 904,623 |
| 404 ගෘහ භාණ්ඩ | 16,350 | 16,350 | 199,250 |
| 406 රථවාහන බලපත්‍ර හා රක්ෂණ | 97,099 | 97,099 | 254,267 |
| | **3,125,426** | **3,125,426** | **3,340,968** |

සටහන -19

| ගිවිසුම්ගත ගත සේවා (කේත අංක : 05) | | | |
|---|---|---|---|
| 501 ප්‍රවාහන | 60,659 | 60,659 | 129,018 |
| 502 දුරකථන ගාස්තු | 927,853 | 927,853 | 993,232 |
| 503 තැපැල් ගාස්තු | 322,763 | 322,763 | 282,789 |
| 504 විදුලිය | 2,307,627 | 2,307,627 | 3,894,590 |
| 505 ජලය | 758,426 | 758,426 | 1,153,009 |
| 506 කුලී ගාස්තු | 5,000 | 5,000 | - |
| 508 විගණන ගාස්තු | 339,398 | 339,398 | 125,000 |
| 510 දැන්වීම් ප්‍රචාරණය | 1,040,304 | 1,040,304 | 1,431,392 |
| 512 ආරක්ෂක සේවා | 2,572,420 | 2,572,420 | 2,557,647 |
| 513 සනීපාරක්ෂක සේවා | 2,328,832 | 2,328,832 | 3,073,018 |
| 514 ඇපුල්ලුම් සේවා | 260,610 | 260,610 | 417,395 |
| 515 ගෙවතු පවිත්‍ර කිරීම් | 1,400 | 1,400 | 51,965 |
| 516 රක්ෂණය | 21,876 | 21,876 | 65,627 |
| 517 පරිවර්ථන ගාස්තු | 73,810 | 73,810 | 108,860 |
| 520 සේවක පුහුණුව (දේශීය/විදේශීය) | 106,725 | 106,725 | 261,496 |
| 521 සාමාජික ගාස්තු | 705,175 | 705,175 | 1,038,833 |
| 523 අනෙකුත් සේවා | 258,732 | 258,732 | 842,817 |
| 524 මුද්‍රණ ගාස්තු මුද්‍රණ අංශය | 129,868 | 129,868 | 103,541 |
| 525 මුද්‍රණ ගාස්තු - ශ්‍රව්‍ය දෘෂ්‍ය | 27,245 | 27,245 | 34,351 |
| 529 සමුපකාර නිලධාරි පුහුණුව | 503,172 | 503,172 | - |
| | **12,751,894** | **12,751,894** | **16,564,579** |

| | 2011 | 2011 | 2012 |
|---|---|---|---|
| **සටහන -20** | රු. | රු. | රු. |
| **වෙනත් වියදම් (කේත අංක :06)** | | | |
| 601 හා 602 නීති ගාස්තු හා පරිත්‍යාග | 11,464 | 11,464 | - |
| 607 සංග්‍රහ වියදම් | 593,124 | 593,124 | 711,510 |
| 703 බැංකු ගාස්තු | 22,424 | 22,424 | 10,134 |
| 705 කාර්ය මණ්ඩලය සඳහා වූ ණය මත පොලී | 43,890 | 43,890 | 37,016 |
| 609 රාජ්‍ය භාෂා පුහුණුව ක්‍රියාත්මක කිරීම | 62,400 | 62,400 | - |
| 707 ජාතිය ගොඩනැගීමේ බදු | 429,394 | 429,394 | 160,522 |
| | **1,162,696** | **1,162,696** | **919,182** |

**සටහන: 5-A**

**ලැබිය යුතු පාඨමාලා ගාස්තු**

| | | | |
|---|---|---|---|
| 3501 සමුපකාර ඩිප්ලෝමාව | 231,997 | 231,997 | 719,770 |
| 3502 සමුපකාර සහතික පත්‍ර පාඨමාලාව | 56,170 | 56,170 | 56,604 |
| 3503 පුහුණු වැඩසටහන් | 68,250 | 68,250 | 87,600 |
| 3505 කෙටිකාලීන පරිගණක පාඨමාලා | - | - | 16,200 |
| 3506 කෙටිකාලීන වෙනත් පාඨමාලා | 531,142 | 531,142 | 923,700 |
| 3507 වෘත්තීය පාඨමාලා | - | - | 150,567 |
| 3508 NICD පරිගණක ඩිප්ලෝමා | 30,250 | 30,250 | 68,570 |
| 3511 ඉංග්‍රීසි පාඨමාලාව | 4,313 | 4,313 | - |
| 3512 තොරතුරු තාක්ෂණ උපාධි පාඨමාලාව | 14,250 | 14,250 | 8,000 |
| 3522 පුස්තකාල හා විභාග ගාස්තු | 25,000 | 25,000 | 33,000 |
| | **961,372** | **961,372** | 2,064,010 |

**සටහන : 5-B**

**තැන්පතු**

| | | | |
|---|---|---|---|
| 3536 ටෙන්ඩර් තැන්පතු | 5,000 | 5,000 | - |
| | 5,000 | 5,000 | - |

**සටහන : 10-A**

**කලින් ලැබූ පාඨමාලා ගාස්තු**

| | | | |
|---|---|---|---|
| 4023 සමුපකාර ඩිප්ලෝමා පාඨමාලා | 1,158,915 | 1,158,915 | 948,667 |
| 4024 කෙටි කාලීන වැඩසටහන් | 565,837 | 565,837 | - |
| 4025 වෙනත් පාඨමාලා | 784,785 | 784,785 | 183,025 |
| 4042 වෘත්තීය පාඨමාලා | | | 7,317 |
| | 2,509,536 | 2,509,536 | 1,139,008 |

| සටහන: 14-A | 2011 | 2011 | 2012 |
|---|---|---|---|
| **පාඨමාලා ගාස්තු ආදායම්** | රු. | රු. | රු. |
| 1001 සමුපකාර උසස් ඩිප්ලෝමාව | 1,470,098 | 1,470,098 | 2,917,047 |
| 1002 NICD පරිගණක ඩිප්ලෝමාව | 983,250 | 983,250 | 1,217,970 |
| 1003 පරිගණක සහතික පත්‍ර පාඨමාලාව | 326,500 | 326,500 | 638,075 |
| 1004 ඉංග්‍රිසි සහතික පත්‍ර පාඨමාලාව | 274,688 | 274,688 | 509,988 |
| 1005 වෘත්තීය පාඨමාලා | | | |
| 1005 -01 පාඨමාලා ගාස්තු ගණකාධිකරණ ශිල්පීය ආයතනය | 46,200 | 46,200 | 534,400 |
| 1005 -02 පාඨමාලා ගාස්තු වරලත් ගණකාධිකරණ | 70,500 | 70,500 | 194,700 |
| 1005 -03 පාඨමාලා ගාස්තු කළමනාකරණ ගණකාධිකාරී සහතිකපත් | 81,000 | 81,000 | 858,600 |
| 1005 -03 පාඨමාලා ගාස්තු බැංකුකරුවන්ගේ බැංකු හා මූල්‍ය සහතිකපත් | | - | 283,250 |
| 1006 තොරතුරු තාක්ෂණ ඩිප්ලෝමා පාඨමාලාව | 193,750 | 193,750 | 883,425 |
| 1007 සමුපකාර සහතික පත්‍ර පාඨමාලාව | 639,341 | 639,341 | 628,675 |
| 1008 කෙටිකාලීන වැඩමුළු | 2,088,350 | 2,088,350 | 2,863,034 |
| 1009 පරිගණක කෙටිකාලීන පාඨමාලා | 494,196 | 494,196 | 319,300 |
| 1010 කෙටිකාලීන පාඨමාලා වෙනත් | 950,515 | 950,515 | 3,352,565 |
| 1011 සමුපකාර ජාලගත කිරීමේ පුහුණු වැඩසටහන | 84,430 | 84,430 | 479,428 |
| 1072 දෙමළ සහතික පත්‍ර පාඨමාලාව | | - | 104,000 |
| | **7,702,818** | **7,702,818** | **15,784,455** |

| සටහන: 14-B | | | |
|---|---|---|---|
| **විවිධ ආදායම්** | | | |
| 1016 වත්තෙන් ලද ආදායම | 31,248 | 31,248 | 44,243 |
| 1034 නේවාසික කළමනාකරණ දීමනා | 96,926 | 96,926 | 127,525 |
| 1038 ඡායා පිටපත් ගාස්තු | 17,751 | 17,751 | 38,742 |
| 1040 උපකරණ කුලී ගාස්තු | 376,141 | 376,141 | 478,365 |
| 1041 වෙනත් සැපයුම් | 7,250 | 7,250 | - |
| 1044 පානීය ජල බෝතල් | 136,870 | 136,870 | 165,685 |
| 1045 සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීමේ ගාස්තු | 82,750 | 82,750 | 104,566 |
| 1046 ඡායාරූප ආදායම් | 67,025 | 67,025 | 49,700 |
| 1047 පුස්තකාල පොත් සඳහා දඩ මුදල් | 10,825 | 10,825 | 39,070 |
| 1048 පොත් බැදීම | 4,870 | 4,870 | 7,880 |
| 1051 විවිධ ආදායම් | 209,651 | 209,651 | 389,558 |
| 1056 බස් රථයෙන් ලද ආදායම | 906,938 | 906,938 | 568,856 |
| 1061 අමතර ආදායම් | 2,110 | 2,110 | 29,751 |
| 1062 හිමිකම් නොපෑ හිඟ ගාස්තු | 146,411 | 146,411 | - |
| 1071 පුවත්පත් විකිණීම හා වෙනත් ප්‍රයෝජනයට ගත නොහැකි භාජන | 16,500 | 16,500 | - |
| 1073 මිල දී ගත් භාණ්ඩ විකුණුම් | - | - | 25,600 |
| 1074 නැති වූ භාණ්ඩ සඳහා අය කිරීම් | - | - | 176,394 |
| | **2,113,265** | **2,113,265** | **2,245,933** |

**සටහන : 02**

**දේපල, පිරියත හා උපකරණ**

| පිරිවැය/ ප්‍රත්‍ය අගය | 2012.01.01 දිනට ශේෂය | පෙර වර්ෂයේ ගැලපීම් | | ගැලපීම්වලට පසු ශේෂය | වසර තුළ එකතු කිරීම් | ගැලපීම් | 2012 සත්‍ය අගය රු. |
|---|---|---|---|---|---|---|---|
| | | එකතු කිරීම් | අඩු කිරීම් | | | | |
| ඉඩම් | 134,707,559 | - | - | 134,707,559 | - | - | 134,707,559 |
| ගොඩනැගිලි සහ ආකෘති | 191,955,884 | - | - | 191,955,884 | 650,615 | - | 192,606,499 |
| යන්ත්‍රසූත්‍ර හා උපකරණ | 43,411,122 | - | - | 43,411,122 | 1,548,063 | (11,876,564) | 33,082,622 |
| රථවාහන | 6,108,331 | - | - | 6,108,331 | 6,260,000 | 6,096,257 | 18, 464,588 |
| ගෘහ භාණ්ඩ | 11,329,607 | - | - | 11,329,607 | 1,058,567 | - | 12,388,175 |
| පුස්තකාල පොත් | 2,107,701 | - | - | 2,107,701 | 86,982 | - | 2,194,684 |
| තිරරෙදි සහ වෙනත් | 1,025,758 | - | (106,026) | 919,733 | 135,485 | (42,191) | 1,013,027 |
| **එකතුව** | **390,645,964** | **-** | **(106,026)** | **390,539,939** | **9,739,713** | **(5,822,498)** | **394,457,154** |
| | | | | | | | |
| **සමුච්චනය කළ ක්ෂවීම්** | **2012.01.01 දිනට ශේෂය** | **පෙර වර්ෂයේ ගැලපීම්** | | **ගැලපීම්වලට පසු ශේෂය** | **වසර තුළ එකතු කිරීම්** | **ගැලපීම්** | **2012 සත්‍ය අගය රු.** |
| | | **එකතු කිරීම්** | **අඩු කිරීම්** | | | | |
| ගොඩනැගිලි සහ ආකෘති | 36,835,124 | - | - | 36,835,124 | 4,798,897 | - | 41,634,021 |
| යන්ත්‍රසූත්‍ර හා උපකරණ | 34,382,316 | - | (1,131,589) | 33,250,726 | 3,779,636 | (16,895,523) | 20,134,840 |
| රථවාහන | 5,922,988 | - | (364,657) | 5,558,330 | 1,919,375 | (4,553,743) | 2,923,962 |
| ගෘහ භාණ්ඩ | 6,908,692 | - | - | 6,908,692 | 831,782 | - | 7,740,474 |
| පුස්තකාල පොත් | 1,966,979 | - | - | 1,966,979 | 67,898 | - | 2,034,877 |
| තිරරෙදි සහ වෙනත් | 971,376 | - | (83,719) | 887,658 | 22,902 | (42,191) | 868,369 |
| **එකතුව** | **86,987,475** | **-** | **(1,579,966)** | **85,407,509** | **11,420,490** | **(21,491,457)** | **75,336,542** |
| **දළ පොත් අගය** | **390,645,964** | **-** | **(106,026)** | **390,539,939** | **-** | **-** | **394,457,154** |
| **සමුච්චනය කළ ක්ෂයවීම්** | **86,987,475** | **-** | **(1,579,966)** | **85,407,509** | **-** | **-** | **75,336,542** |
| **ශුද්ධ අගය** | **303,658,489** | **-** | **1,473,940** | **305,132,430** | **-** | **-** | **319,120,612** |
| | | | | | | | |
| **(ප්‍රාග්ධන) නොනිමි වැඩ** | **2012.01.01 දිනට ශේෂය** | **පෙර වර්ෂයේ ගැලපීම්** | | **ගැලපීම්වලට පසු ශේෂය** | **වසර තුළ එකතු කිරීම්** | **ගැලපීම්** | **2012 සත්‍ය අගය රු.** |
| | | **එකතු කිරීම්** | **අඩු කිරීම්** | | | | |
| 2/2/6/20-ශ්‍රවනාගාරය | 130,173,448 | - | - | 130,173,448 | 8,089,000 | 1,437,523 | 139,699,971 |
| | **130,173,448** | **-** | **-** | **130,173,448** | **8,089,000** | **1,437,523** | **139,699,971** |
| **ඉදිරියට ගෙන ගිය අගය** | **433,831,937** | **-** | **1,473,940** | **435,305,877** | **-** | **-** | **458,820,582** |

# 2012.12.31 දිනට ගිණුම්වල අදාල සටහන්

## සටහන : 01

## ගිණුම්කරණ ප්‍රතිපත්ති

### 1. 1 පොදු ගිණුම්කරණ ප්‍රතිපත්ති

### 1. 1 අ. ගිණුම්කරණ සම්ප්‍රදායයන්

ආයතනයේ මූල්‍ය ප්‍රකාශන ශේෂ පත්‍රය, ආදායම් සහ වියදම් ගිණුම, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ ගිණුම්වලට සටහන් වලින් සමන්විත වේ. ආයතනයේ මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය මත පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම අනුව පිළියෙල කොට ඇත. මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී මෙම මූලධර්ම ඒකීයව යොදවනු ලැබේ.

### 1. 1 ආ. ගිණුම් ආකෘති

මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරනු ලැබූ ගිණුම් ආකෘතීන්ට අනුකූලව පිළියෙල කොට ඇත. වර්තමාන වර්ෂය සමඟ ඒකීය වන අයුරින් පෙර වර්ෂවල වාර්තා අගයන් සහ ප්‍රකාශනයන් යළි සකස් කොට ඇත.

### 1. 1 ඇ. ශේෂ පත්‍ර දිනට පසු සිදුවීම්

ශේෂ පත්‍රදිනට පසු සියළුම ප්‍රමාණාත්මක සිදුවීම් සැළකිල්ලට භාජනය කර ඇති අතර, අවශ්‍ය පරිදි මූල්‍ය ප්‍රකාශනවලට ගැලපීම් කිරීම් සහ හෙළිදරව් කිරීම් සිදු කර ඇත.

### 2 වත්කම් සහ ඒවා අගය කිරීමේ පදනම

### 1.2 අ. දේපල, පිරියත සහ උපකරණ

දේපල, පිරියත සහ උපකරණවල පිරිවැය ඒවායේ මිලදී ගත් පිරිවැය හෝ ඉදිකිරීමට වැය කරන ලද අගය සමඟ ඒවායේ පිරිවැය හා අදාල කරගත හැකි අනෙකුත් වියදම් සමඟ ඉදිරිපත් කොට ඇත. දේපල, පිරියත සහ උපකරණ ගිණුම්ගත කොට ඇත්තේ පිරිවැය හෝ ප්‍රති අගය කරන ලද වටිනාකමෙන්, පහත සඳහන් අනුපාතයන්ට අනුව කරන ලද සමුච්චිත ක්ෂය අඩු කිරීමෙන් පසුවයි.

## 1.2 ආ. ක්ෂය කිරිම

වත්කම්වල පිරිවැය, ඒවායෙහි ඇස්තමේන්තුගත ඵලදායී ජීවිත කාලය පුරා සමාන වාර්ෂික වාරික වලින් ලියා හැරීම පදනම් කොට ගෙන පහත සඳහන් පරිදි ක්ෂයවීම් සඳහා වෙන් කිරීම් ගණනය කොට ඇත.

| වත්කම | ඵලදායි ජීවිත කාලය |
|---|---|
| ගොඩනැගිලි | වර්ෂ 40 |
| මෝටර් රථ වාහන | වර්ෂ 04 |
| ලීබඩු සහ උපකරණ | වර්ෂ 10 |
| පොත් සහ සඟරා | වර්ෂ 04 |
| යන්ත්‍ර සූත්‍ර | වර්ෂ 05 |
| තිර රෙදි හා අනෙකුත් දෑ | වර්ෂ 03 |

වත්කම් වෙනුවෙන් මිලදී ගත් වර්ෂයේ හෝ ඉදිකරන ලද වර්ෂයේ භාවිතා කළ කාලය පදනම් කරගෙන ක්ෂය වෙන් කිරීම් කරන අතර, ඒවා විකුණන වර්ෂයේ හෝ ඉවත් කරන වර්ෂයේදීත් භාවිතා කළ කාලය සඳහා ක්ෂය වෙන් කිරීම් කරනු ලබයි. විදුලි ට්‍රාන්ස්ෆෝමර් 2ක් සඳහා දර ඇති වියදම විලම්භනය කර ඇති අතර එහි මුළු පිරිවැය ක්‍රමක්ෂය ලෙස වසර 40ක කාලයක් තුළ ලියා හරිනු ලැබේ. තිරරෙදි සපයා සවි කිරීම හා මෙට්ට හා අනෙකුත් රෙදි සඳහා දැරූ වියදම් ද විලම්භනය කර වර්ෂ 3ක කාලයක් තුළ සමානව ලාභාලාභ ගිණුමට ලියාහරිනු ලැබේ.

## 1.3 වගකීම් සහ වෙන් කිරීම්

## 1.3 අ. පාරිතෝෂික සඳහා වෙන් කිරීම්

ශේෂ පත්‍ර දිනයේ සිට වාර්ෂික සේවා කාලයක් ඉක්මවා ඇති සේවා දායකයින් සඳහා 1983 අංක 12 දරණ පාරිතෝෂික පනත අනුව විශ්‍රාම ගැන්වීමේ පාරිතෝෂික සඳහා වෙන් කිරීම් කරනු ලැබේ.

අදාල ව්‍යවස්ථා සහ රෙගුලාසිවලට අනුකූලව සේවාදායකයින් සේවක අර්ථ සාධක අරමුදලට සහ සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලට හිමිකම් කියනු ලබයි. ආයතනය විසින් පිළිවෙලින් 15% සහ 3% වශයෙන් සේවක අර්ථ සාධක අරමුදලට සහ සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලට සේවාදායකයන්ගේ මූලික වැටුප මත දායක වනු ඇත.

## 1.3 ආ. බොල් ණය සඳහා ප්‍රතිපාදන

බොල් ණය සඳහා ප්‍රතිපාදන වෙන්කර නැත.

## 1.3 ඇ. අනෙකුත් වගකීම්

මූල්‍ය ප්‍රකාශනවල සේවාදායකයන්ගේ සහ වෙනත් පාර්ශවයන්ගේ නෛතික ක්‍රියාමාර්ග නිසා ඇතිවිය හැකි අසම්භාව්‍යයන් සඳහා ප්‍රතිපාදන වෙන්කර නොමැත.

## 1.4 අ. ආදායම් හඳුනාගැනීම

- සපයන ලද සේවා සඳහා ගාස්තු උපචිත පදනම මත ගිණුම්ගත කරනු ලැබේ.
- සේවා සැපයූ කාලය පදනම් කරගෙන ඩිප්ලෝමා පාඨමාලා සහ අනෙකුත් සහතික පත්‍ර පාඨමාලා ගාස්තු ගිණුම්ගත කරනු ලැබේ.
- පොලී ආදායම් උපචිත සංකල්පයට අනුව ගිණුම්ගත කරනු ලැබේ.

## 1.4 ආ. වියදම්

සියළු වියදම් කාලපරිච්ඡේද සංකල්පයට අනුව ගිණුම්ගත කරනු ලැබේ.

## 1.5 රජයේ ප්‍රතිපාදන

## 1.5 අ. ප්‍රාග්ධන ප්‍රතිපාදන

ප්‍රාග්ධන ස්වරූපයෙන් ලබන රජයේ ප්‍රතිපාදන වත්කම් සහ වගකීම් ප්‍රකාශයේ සංචිත ලෙස හඳුනා ගනු ලබයි.

## 1.5 ආ. පුනරාවර්තන ප්‍රතිපාදන

ප්‍රතිපාදන ලැබූ වර්ෂයේ ආදායම් ලෙස ආදායම් සහ වියදම් ගිණුමේ ගිණුම්ගත කරනු ලැබේ.

පුහුණු වැඩසටහන් සඳහා මහජන බැංකුවේ සමුපකාර අරමුදලෙන් රු.800,000/-ක් ප්‍රදාන ලෙස 2011 වර්ෂයේදී ලැබුණි. එයින් රු.234,163.40ක් වියදම් කර පුහුණු වැඩසටහන් 03ක් එම වර්ෂයේදී පවත්වා, එම මුදල කෙටිකාලීන පාඨමාලා ආදායම් යටතේ පෙන්වා ඇත. ඉතිරි උපයෝජනය නොකළ ප්‍රදාන රු.565,836.60ක මුදල කලින් ලද පාඨමාලා ගාස්තු යටතේ පෙන්වනු ලැබිය.

කාල පරිච්ඡේදය තුළ සමුපකාර ක්ෂේත්‍රයේ පුහුණු වැඩසටහන් පැවැත්වීම සඳහා රු.750,000ක මුදලක් මහජන බැංකු සමුපකාර අරමුදලින් ලැබී ඇත. 2012 වසරේ පුහුණු මාර්ගෝපදේශය මුද්‍රණය කර ඇත්තේ 2011 වර්ෂයේ ප්‍රයෝජනයට නොගත් රු.565,836.60ක මහජන බැංකු ප්‍රදානද ඇතුලත් කරමින්ය. පුහුණු මාර්ගෝපදේශය මුද්‍රණ පිරිවැය සඳහා රු.135,861/=ක් දරා ඇත. කාලපරිච්ඡේදය තුළ සමුපකාර ක්ෂේත්‍රය සඳහා පුහුණු වැඩසහන් 23ක් 2011 වර්ෂයේ ප්‍රයෝජනයට නොගත් මහජන බැංකු ප්‍රදාන වලින් සහ වර්ෂය තුල ලද ප්‍රදාන වලින් පවත්වා ඇත. මුළු පුහුණු පිරිවැය රු. 1,876,832.43ක් වන අතර මෙම පිරිවැය තුළ කෙටිකාලීන පුහුණු පාඨමාලා ඇතුලත් වේ.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරීම ආයතනයේ කළමනාකාරිත්වයේ වගකීමකි.

1.7 2012.12.31 දින ගබඩාවේ හා මුද්‍රණාල අංශයේ ලිපි ද්‍රව්‍ය අනෙකුත් කාර්යාල උපකරණ තොග සාමාන්‍ය මධ්‍ය ක්‍රමයට අගය කොට ඇති අතර අලෙවිය සඳහා ඇති ප්‍රකාශන පිරිවැයට අගය කොට ඇත.

1.8 මුදල් ප්‍රවාහ ප්‍රකාශනය වක්‍ර ක්‍රමයට පිළියෙල කර ඇත.

1.9 ආයතනයේ හිටපු නිලධාරින් විසින් ආයතනයට එරෙහිව නඩු 02ක් ගොනු කර ඇති අතර, ඔවුන් පදිංචිව සිටි නිල නිවාස වලින් ඉවත් කිරීම සඳහා ආයතනය විසින් නීති මගින් කටයුතු කර ඇත.

1.10 2012.12.31 දිනට ආයතනයේ සේවක සංඛ්‍යා 31 වේ.

1.11 2012.12.31 දිනට සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද වත්කම්වල සාරාංශයක් පහත දැක්වේ.

| වත්කම් කාණ්ඩය | පිරිවැය රු. මිලියන වලින් |
|---|---|
| අ. යන්ත්‍ර සූත්‍ර හා උපකරණ | 31.92 |
| ආ. පුස්තකාල පොත් | 1.92 |
| ඇ. මෝටර් රථ වාහන | 6.10 |
| ඈ. ලී බඩු හා සවිකිරීම් | 3.87 |
| **එකතුව** | **43.81** |

වර්ෂය අවසන් දිනට රු. මිලියන 20.66ක් පිරිවැය වන යන්ත්‍ර සූත්‍ර උපකරණ සහ රු. මිලියන 4.55ක් පිරිවැය වන මෝටර් රථ වාහන ප්‍රත්‍යාගණනය කර එම අගයන් පහත පරිදි ගිණුම්වලට ගෙන ඇත.

| වත්කම් කාණ්ඩය | මුළු පිරිවැය | 2012.12.31 දිනට ක්ෂයවීම් | ශුද්ධ පොත් අගය | ප්‍රත්‍යාගණන අගය |
|---|---|---|---|---|
| 1. යන්ත්‍ර, සූත්‍ර උපකරණ | 20,661,140.56 | 16,657,122.56 | 4,004,017.98 | 10,460,500.00 |
| 2. මෝටර් රථ වාහන | 4,553,743.00 | 4,553,743.00 | - | 10,650,000.00 |
| **මුළු වටිනාකම** | **25,214,883.54** | **21,210,856.56** | **4,004,017.98** | **21,110,500.00** |

සම්පූර්ණයෙන්ම ක්ෂය කරන ලද දැනට භාවිතයේ නොමැති රුපියල් මිලියන 5.02ක් වටිනා වත්කම් පවතින අතර භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලය විසින් මෙම වත්කම් විකිණීමට අනුමැතිය ලබාදී ඇත. එය පහත පරිදි වේ.

| වත්කම් විස්තරය | පිරිවැය රු. මිලියන |
|---|---|
| 1. කාර්යාල උපකරණ හා ගෘහ භාණ්ඩ සවි කිරීම | 470,510 |
| 2. පරිගණක හා දෘඩාංග | 4,556,559 |
| **මුළු එකතුව** | **5,027,069** |

1.12 විකිණීමේ හෝ නැවත එවීමේ පදනම මත සරසවි පොත්හල වෙත යවා ඇති රු.6,000/=ක් වටිනා පොත් 12ක් 2012.12.31 දිනට නොවිකිණී තිබුනි. එහි පිරිවැය රුපියල් 2,069,152.

**ජාතික සමූපකාර සංවර්ධන ආයතනයේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.**

---

ජාතික සමූපකාර සංවර්ධන ආයතනයේ 2012 දෙසැම්බර් 31 දිනට, මූල්‍ය තත්ත්ව ප්‍රකාශය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් හා වියදම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 2001 අංක 1 දරන ජාතික සමූපකාර සංවර්ධන ආයතනය (සංස්ථාගත කිරීමේ) පනතේ 22 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර ආයතනයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් ආයතනයේ සභාපති වෙත 2013 අගෝස්තු 16 දින නිකුත් කරන ලදී.

1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

1.3 විගණකගේ වගකීම

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් හා හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීමද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි

සැලසුම්කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උප වගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ තත්වාගණනය කළ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.4 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම

---------------------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

2. මූල්‍ය ප්‍රකාශන

-----------------

2.1 තත්ත්වාගණනය කළ මතය

--------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2012 දෙසැම්බර් 31 දිනට ජාතික සමූපකාර සංවර්ධන ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

-------------------------------------------

2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

------------------------

පාවිච්චියෙන් ඉවත් කර තිබුණු රු.37,679,234 ක් වූ පරිගණක, ලී බඩු, කාර්යාල උපකරණ, යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ, පුස්තකාල පොත් යනාදී ස්ථාවර වත්කම් ගිණුම්වලින් ඉවත් කිරීමට හෝ මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීමට හෝ කටයුතු කර නොතිබුණි.

2.2.2 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

---------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වර්ෂ 01 සිට වර්ෂ 05 ක් අතර කාලයක සිට හිඟහිටව තිබුණු පාඨමාලා ගාස්තු හා බාහිර සේවා ගාස්තු එකතුව වූ රු.1,153,412 ක් 2013 අගෝස්තු 30 දින වන විටත් අයකර ගෙන නොතිබුණි.

(ආ) 2012 දෙසැම්බර් 31 දිනට වර්ෂ 05 කට වැඩි කාලයක සිට රු.14,999,156 ක් වූ ලැබිය යුතු එකතු කළ අගය මත බදු (VAT) සමුච්චිත වී තිබුණත්, එම ශේෂ අයකර ගෙන නොතිබුණි.

2.2.3 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

-----------------------------------------------------------------------------

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ යනාදියට යොමුව | අනුකූල නොවීම |
| --- | --- |
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය | |
| (අ) XIX පරිච්ඡේදයේ 5.3 වගන්තිය | උපලේඛණගත රජයේ නිවාසයක පදිංචි වීම වෙනුවෙන් සේවකයන්ගේ වැටුපෙන් සියයට 10 ක් හෝ ආර්ථික කුලියක් අයකරනු වෙනුවට සේවකයන් 09 දෙනෙකු පදිංචි උපලේඛණ ගත නිල නිවාස වලින් රු.750 සිට රු.2,000 දක්වා වූ සුළු නාමික කුලියක් අය කර තිබුණි. |
| (ආ) VII පරිච්ඡේදයේ 12 වගන්තිය හා 1997 පෙබරවාරි 03 දිනැති අංක 06/97 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | 2012 දෙසැම්බර් 31 දින වන විට වර්ෂ 3 කට වැඩි කාලයක් අධ්‍යක්ෂ (අධ්‍යයන හා සංවර්ධන) තනතුරෙහි වැඩ බැලීම වෙනුවෙන් කථිකාචාර්යවරයෙකුට චක්‍රලේඛයට පටහැනිව එකතුව රු.366,013 ක් වූ වැඩ බැලීමේ දීමනා ගෙවා තිබුණි. |

2.2.4 විධිමත් අධිකාර බලය නොලත් ගනුදෙනු

-----------------------------------------
ආයතනයේ කථිකාචාර්යවරුන්ගෙන් ප්‍රමාණවත් හා කාර්යක්ෂම සේවයක් ලබා ගැනීමේ අරමුණ ඇතිව අවම වශයෙන් මසකට දේශන පැය 60 බැගින් වර්ෂයකට දේශන පැය 720 ක් ආවරණය වන පරිදි ආයතනයේ සේවයේ නියුතු කථිකාචාර්යවරු 06 දෙනාට වර්ෂයකට දේශන පැය 4,320 ක කාලසටහන් පිළියෙල කළ යුතුව තිබුණි. ආයතනය මගින් සංවිධානය කර පවත්වනු ලබන පාඨමාලා සඳහා සතියේ දිනවල දේශන පැවැත්වීම වෙනුවෙන් දේශන ගාස්තු නොගෙවිය යුතු බවත්, අවම දේශන පැය සංඛ්‍යාව ආවරණය නොකරන කථිකාචාර්යවරුන් හට බාහිර ආයතනවල ඉල්ලීම මත පවත්වනු ලබන පාඨමාලා සඳහා දේශන පැවැත්වීම වෙනුවෙන්ද දේශන ගාස්තු නොගෙවිය යුතු බවත් ආයතනයේ කළමනාකරණ මණ්ඩලය විසින් 2009 ජූනි 19 දින පවත්වන ලද 59 වැනි කළමනාකරණ මණ්ඩල රැස්වීමේදී තීරණය කර තිබුණි. ඊට පටහැනිව ආයතනය කටයුතු කිරීම සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) කථිකාචාර්යවරුන්ගේ අවම දේශන පැය සංඛ්‍යාව ආවරණය වන පරිදි පාඨමාලාවල කාල සටහන් පිළියෙල කර නොතිබුණු අතර කථිකාචාර්යවරුන් විසින් 2012 වර්ෂයේදී පවත්වා තිබුණු තථ්‍ය දේශන පැය 2,274 ක් විය. එය අවම දේශන පැය සංඛ්‍යාවෙන් සියයට 53 ක් වී තිබුණි.

(ආ) කළමනාකරණ මණ්ඩලය තීරණය කළ අවම දේශන පැය සංඛ්‍යාව ආවරණය කර නොතිබියදී, ආයතනය විසින් සංවිධානය කර පවත්වා තිබුණු පාඨමාලා සඳහා සතියේ දිනවල පැවැත්වූ දේශන පැය 335 ක් වෙනුවෙන් දේශන ගාස්තු වශයෙන් රු.260,750 ක් හා බාහිර ආයතනවල ඉල්ලීම මත පවත්වා තිබුණු පාඨමාලා සඳහා දේශන පැය 314 ක් වෙනුවෙන් දේශන ගාස්තු රු.171,500 ක් අවිධිමත් පරිදි කථිකාචාර්යවරුන් දෙදෙනෙකුට ගෙවා තිබුණි.

(ඇ) ආයතනය විසින් සංවිධානය කර පවත්වනු ලබන පාඨමාලාවන් සඳහා ආයතනයේ සේවයේ නියුක්ත ස්ථිර කථිකාචාර්යවරුන්ගේ ආවරණය කළ යුතු පැය 4,320 කින් පැය 2,274 ක් පමණක් දේශන පවත්වා තිබියදී, ප්‍රමාණවත් හා කාර්යක්ෂම සේවයක් ඔවුන්ගෙන් ලබා ගැනීම වෙනුවට බාහිර කථිකාචාර්යවරුන්ගේ සේවය ලබාගෙන දේශන ගාස්තු වශයෙන් රු.4,178,063 ක් සමාලෝචිත වර්ෂයේදී ගෙවා තිබුණි.

## 3 මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය තුළ ආයතනයේ මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵලය රු. 6,086,352 ක ඌනතාවයක් වූ අතර, ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 185,848 ක් වූයෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු. 5,900,504 ක තවදුරටත් පිරිහීමක් දක්නට ලැබුණි.

### 3.2 වියදම්වල වැඩිවීම හා අඛණ්ඩ ඌනතාවය

2008 වර්ෂයේ සිට 2012 වර්ෂය දක්වා වූ පස් අවුරුදු කාලය තුළ ආයතනයේ වියදම් වැඩිවීම හා ඊට සාපේක්ෂව ආදයම අඩුවීමත් නිසා අඛණ්ඩව පැවති ඌනතාවය පිළිබඳව විස්තර පහත දක්වේ.

| | 2012 | 2011 | 2010 | 2009 | 2008 | එකතුව |
|---|---|---|---|---|---|---|
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| විස්තීරණ ආදයම් හා වියදම් ප්‍රකාශනය අනුව අතිරික්තය/(ඌනතාවය) | (6.09) | (0.19) | (7.30) | (6.17) | (4.14) | 23.89) |
| ක්ෂය වීම් | 10.03 | 11.19 | 10.30 | 9.36 | 8.63 | 49.51 |
| ක්ෂය ගැලපීමට පෙර අතිරික්තය | 3.94 | 11.00 | 3.00 | .19 | 4.49 | 25.62 |
| අඩු කළා : | | | | | | |
| පුනරාවර්තන ප්‍රදාන හා ප්‍රාග්ධන ප්‍රදාන හිලව් කිරීම හා ප්‍රත්‍යාගණන ලාභ | 44.73 | 32.47 | 22.39 | 21.47 | 19.68 | 140.74 |
| ඌනතාවය | (40.79) | 21.47) | (19.39) | (18.28) | (15.19) | (115.12) |

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2008 සිට 2012 දක්වා වූ වර්ෂ 05 තුළ ආයතනයෙහි වියදම් එකතුව රු.මිලියන 253.82 ක් වූ අතර වෙනත් ආදයම්වල එකතුව රු.මිලියන 138.70 ක්

විය. මේ අනුව, ආදයමට වඩා වියදමෙහි වැඩිවීම රු. මිලියන 115.12 ක් වුවත් ආයතනයෙහි වියදම වැඩිවීමට සාපේක්ෂව ආදයමේ වැඩිවීමක් සිදුවී නොතිබුණි.

(ආ) කෙසේ වෙතත් 2008 සිට 2012 වර්ෂය දක්වා වර්ෂ 05 තුළ ආයතනයෙහි වත්කම් ක්ෂය ප්‍රතිපාදන රහිතව රු.මිලියන 43.33 ක ප්‍රාග්ධන වර්ධනයක් පැවතියද, එම කාලය තුළ පුනරාවර්තන ප්‍රදාන ලෙස ලැබුණු රු.මිලියන 114.27 ක් ආයතනයට නොලැබුණේ නම්, රු.මිලියන 8.76 ක ප්‍රාග්ධන ප්‍රදාන හිලව් කිරීම් නොකළේ නම් හා වත්කම් ප්‍රත්‍යාගණන ලාභ රු.මිලියන 17.71 ක් ගිණුම්ගත නොකළේ නම් මෙම පස් අවුරුදු කාලය තුළ රු.මිලියන 97.41 කින් ප්‍රාග්ධන බාදනයක් සිදුවිය හැකිව තිබුණි. එබැවින් ආයතනයේ අඛණ්ඩ පැවැත්මේ අවිනිශ්චිතතාවයක් පවතිය යන්න විගණනයේදී බැහැර කළ නොහැකි විය.

4. මෙහෙයුම් සමාලෝචනය
------------------------------

4.1 කාර්ය සාධනය
-------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2001 අංක 1 දරන ජාතික සමුපකාර සංවර්ධන ආයතනය (සංස්ථාපනය කිරීමේ) පනතේ 4 වගන්තිය පරිදි ආයතනය සංස්ථාගත කිරීමෙන් සාක්ෂාත් කර ගැනීමට අපේක්ෂිත වූ පහත දැක්වෙන ප්‍රධාන කාර්යයන් ඉටු කර නොතිබුණි.

(i) සමුපකාර සංවර්ධනය පිළිබඳ පර්යේෂණ ප්‍රවර්ධනය කිරීම.

(ii) සමුපකාර සංවර්ධනයට අදාල දත්ත රැස්කිරීම අරහයා සම්පත් මධ්‍යස්ථානයක් වශයෙන් ක්‍රියාකිරීම හා රැස්කරන ලද දත්ත ප්‍රකාශනය කිරීම මගින් සංචයනය කිරීම හා පතල කිරීම

(iii) කළමනාකරණ නිපුනතා අවශ්‍යවන සමුපකාර ව්‍යවසායන් භාරගෙන කළමනාකරණය කිරීම.

(iv) සමුපකාර ව්‍යවසායවලට වෘත්තීය උපදෙස් සැපයීම.

(ආ) ආයතනය විසින් පවත්වන ලද පාඨමාලාවල ප්‍රගතිය ඉකුත් වර්ෂය සමග සසඳ පහත දැක්වේ.

| පාඨමාලාව/වැඩසටහන | 2012 | | | | 2011 | |
|---|---|---|---|---|---|---|
| | ඉලක්කගත | | තථ්‍ය | | තථ්‍ය | |
| | පාඨමාලා/ වැඩසටහන් සංඛ්‍යාව | සහභාගී වූ පුහුණුලාභීන් සංඛ්‍යාව | පාඨමාලා/ වැඩසටහන් සංඛ්‍යාව | සහභාගී වූ පුහුණුලාභීන් සංඛ්‍යාව | පාඨමාලා/ වැඩසටහන් සංඛ්‍යාව | සහභාගී වූ පුහුණුලාභීන් සංඛ්‍යාව |
| සමුපකාර නිත්‍ය පුහුණු පාඨමාලා | 02 | 72 | 02 | 92 | 03 | 110 |
| උසස් ඩිප්ලෝමා පාඨමාලා | 15 | 309 | 14 | 279 | 16 | 297 |
| සහතික පත්‍ර පාඨමාලා | 07 | 155 | 06 | 173 | 05 | 81 |
| කෙටිකාලීන කළමණාකරණ සංවර්ධන පුහුණු වැඩසටහන් | 24 | 600 | 18 | 491 | 12 | 351 |
| බාහිර ආයතනවල ඉල්ලුම මත පවත්වන ලද පුහුණු වැඩසටහන් | - | - | 19 | 850 | 16 | 682 |
| සමුපකාර ක්ෂේත්‍රයේ උන්නතිය උදෙසා නොමිලයේ පවත්වන ලද පුහුණු වැඩසටහන් | - | - | 23 | 764 | 08 | 380 |
| බාහිර උපාධි හා වෘත්තීය ගිණුම්කරණ විභාග සඳහා උපකාරක වැඩ සටහන් | - | - | 10 | 213 | 04 | 57 |
| එකතුව | 48 | 1,136 | 92 | 2,862 | 64 | 1,958 |

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) සමාලෝචිත වර්ෂයේ ඉලක්කගත කෙටිකාලීන කළමනාකරණ සංවර්ධන පුහුණු වැඩසටහන් 24 ක් පැවැත්වීමට ඉලක්ක කර තිබුණද, පවත්වා තිබුණේ වැඩසටහන් 18 ක් පමණකි. ඒ අනුව කාර්ය සාධනය සියයට 75 ක් විය.

(ii) බාහිර ආයතනවල ඉල්ලුම මත හා සමුපකාර ක්ෂේත්‍රයේ උන්නතිය උදෙසා නොමිලයේ පවත්වන පුහුණු වැඩසටහන් සහ බාහිර උපාධි හා වෘත්තීය ගිණුම්කරණ විභාග සඳහා උපකාරක වැඩසටහන් සමාලෝචිත වර්ෂයේදී පවත්වා තිබුණද, ඒවායේ ඉලක්ක තීරණය කර නොතිබුණි.

4.2 අරමුදල් ඌන උපයෝජනය

---------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ශ්‍රවණාගාරය ඉදිකිරීම් කටයුතුවල පැවති වර්ෂ 4 ක ප්‍රමාදය හේතුවෙන් 2010 වර්ෂයේ භාණ්ඩාගාරයෙන් ලැබුණු රු.20,056,450 ක් වූ ප්‍රාග්ධන ප්‍රදාන ප්‍රයෝජනයට නොගෙන බැංකු ජංගම ගිණුමේ වර්ෂ 02 ක පමණ කාලයක් නිශ්ක්‍රියව තබා තිබුණි.

(ආ) සමුපකාර ක්ෂේත්‍රයේ 2010 වර්ෂයේ ජාතික ඵලදායිතා කාර්යසාධන තරඟ වැඩසටහන් සඳහා රාජ්‍ය බැංකුවකින් 2011 මැයි 31 දින ලැබුණු රු.2,932,250 ක් වූ ප්‍රදානයකින්, රු.1,342,856 ක් උපයෝජනය නොකර 2012 දෙසැම්බර් 31 දින වනවිටත් බැංකු ජංගම ගිණුමේ තැන්පත් කර තිබුණි.

(ඇ) වර්ෂ 05 ක කාලයක් තිස්සේ බැංකු ජංගම ගිණුම්වල සමුච්චිත වී තිබුණු රු.893,843 ක් ඵලදායී ලෙස ප්‍රයෝජනයට ගෙන නොතිබුණි.

4.3 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

----------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ප්‍රධාන තක්සේරුකරු අනුව, බහු කාර්ය ගොඩනැගිල්ලේ බිම් මහලේ වාර්ෂික කුලී තක්සේරුව රු.390,000 ක් වුවත්, එය රු.195,000 ක වාර්ෂික කුලියක් මත 2010 අප්‍රේල් 01 දින සිට 2015 මාර්තු 31 දින දක්වා වර්ෂ 05 කට සමුපකාර සමිති සංගමයකට තක්සේරු මුදල නොසලකා අවිධිමත් ලෙස බදු දී තිබුණි. මේ හේතුවෙන් 2012 දෙසැම්බර් 31 දිනට රු. 536,250 ක කුලී ආදායමක් ආයතනයට අහිමි වී තිබුණි.

(ආ) ආයතනයේ බස් රථය පෞද්ගලික පාර්ශ්වයන්ටද කුලියට ලබාදී තිබුණු අතර ඒ සඳහා කිලෝමීටර් 100 ක් වෙනුවෙන් දිනකට රු.8,000 ක මූලික ගාස්තුවක් හා අමතර කිලෝමීටර් 01 ක් වෙනුවෙන් රු.65 ක් බැගින් ගාස්තුවක් අය කර ගත යුතුව තිබුණි. නමුත් රේඛීය අමාත්‍යාංශ නිලධාරීන්ගේ පෞද්ගලික ගමන් සඳහා ගාස්තු අය නොකර, බස් රථය කිලෝමීටර් 12,505 ක් ධාවනය කිරීම සඳහා ඉන්ධන වෙනුවෙන් රු.277,626 ක් වැය කර තිබුණි. තවද, ඒ වෙනුවෙන් අයවිය යුතු රු.841,780 ක් ආයතනයට අහිමි වී තිබුණි.

4.4 අනාර්ථික ගනුදෙනු

----------------------

තොරතුරු තාක්ෂණ විෂයයට අදල පාඨමාලා ප්‍රවර්ධනය කිරීම වෙනුවෙන් ආයතනයේ අනුමත සේවක සංඛ්‍යාවෙන් බැහැරව කොන්ත්‍රාත් පදනම මත උපදේශකවරයකු බඳවාගෙන 2012 වර්ෂයේදී උපදේශක දීමනා වශයෙන් රු.360,000 ක් ගෙවීම් කර තිබුණි. කෙසේ නමුත් ඔහුගේ උපදේශකත්වයෙන් නව පාඨමාලා ආරම්භ කිරීමට හෝ පාඨමාලා සඳහා පුහුණුලාභීන්ගේ සහභාගීත්වය වර්ධනය කරලීමට හෝ පාඨමාලාවල තත්ත්වය නැංවීමට හෝ ආදායම වර්ධනය කිරීමට හෝ කටයුතු සිදුකර නොතිබුණු අතර උපදේශක සේවා ලබා ගැනීම තුළින් මෙම පාඨමාලාවන්හි අපේක්ෂිත ප්‍රවර්ධනයක් සිදුව නොතිබුණි

4.5 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

-----------------------------------------

මුද්‍රණ අංශයට අයත් මුද්‍රණ යන්ත්‍ර 03 ක් පාවිච්චියට නොගෙන වර්ෂ 10 කට වැඩි කාලයක් නිශ්ක්‍රීයව තිබුණි.

4.6 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

--------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ශ්‍රවණාගාරය ඉදිකිරීම

-------------------------

ශ්‍රවණාගාරය ඉදිකිරීම සඳහා රු. මිලියන 44.5 ක පිරිවැය ඇස්තමේන්තුවකට පෞද්ගලික ඉදිකිරීම් සමාගමකට 2001 අගෝස්තු මාසයේදී පවරා තිබුණි. ඉදිකිරීම් කටයුතු 2003 අප්‍රේල් මාසය වන විට අවසන් කළ යුතුව තිබුණද, වහලය ඉදි කිරීම් කටයුතු සිදු කෙරෙමින් පැවතියදී 2005 පෙබරවාරි 14 දින වහලය කඩා වැටීම නිසා ඉදි කිරීම් අතරමඟ නතර වී තිබුණි. කෙසේ වෙතත්, වහලයේ සම්පූර්ණ ඉදිකිරීම්ද ඇතුළත්ව ඉතිරි වැඩ නිම කිරීම සඳහා රු.මිලියන 113 ක් වූ නව පිරිවැය ඇස්තමේන්තුවකට ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශයට 2009 වර්ෂයේදී පවරා, 2010 දෙසැම්බර් 31 දින අවසන් කළ යුතු වුවත්, 2013 ජූලි 30 දින වන විටත් ඉදිකිරීම් නිම වී නොතිබුණි.

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ඉදිකිරීම් අභ්‍යාස හා සංවර්ධන ආයතනයෙන් ලබා දී තිබූ ආරවුල් නිරාකරණය කිරීමේ වාර්තාව හා 2012 මැයි 31 දිනැති අංක සීඅයිටී/4/4/8/2 දරන රේඛීය අමාත්‍යාංශ ලේකම්වරයාගේ ලිපිය අනුව වහලය කඩා වැටීම නිසා ආයතනයට සිදුව තිබූ රු.3,907,904 ක් වූ අලාභය, ඉදිකිරීම් සඳහා උපදේශක සේවා සැපයූ උපදේශකවරියගෙන් හා ඉදිකිරීම් සමාගමෙන් සියයට 50 බැගින් අයකර ගැනීම සඳහා නීතිමය ක්‍රියා මාර්ග ගැනීමට නියෝග කර තිබුණද, 2013 ජූනි 30 දින වන විටත් එම අලාභ අය කර ගෙන නොතිබුණි.

(ii) උපදේශක සේවා සැපයූ උපදේශකවරිය රාජ්‍ය සේවයේ නියුක්තව සිටියදී අනවසරයෙන් පෞද්ගලික උපදේශක සේවා සපයා, රු.මිලියන 2.15 ක් වූ ගාස්තු ලබා ගැනීම සම්බන්ධයෙන් ඇයට එරෙහිව විනයානුකූලව කටයුතු කර නොතිබුණි.

(iii) ඉදිකිරීම් ආරම්භ කළ 2001 වර්ෂයේ සිට 2012 දෙසැම්බර් 31 දින දක්වා වර්ෂ 11 ක දීර්ඝ කාල ප්‍රමාදය හා විටින් විට ඉදිකිරීම් සැලසුම් සංශෝධනය වීම හේතුවෙන් රු.මිලියන 44.5 ක පිරිවැයකට නිම කළ හැකිව තිබුණු ඉදිකිරීම්, මුළු පිරිවැය රු.මිලියන 255.0 ක් දක්වා එනම්, රු. මිලියන 210.5 කින් වැඩි වී තිබුණි.

(ආ) සේවා පහසුකම් ප්‍රසම්පාදනය
-----------------------------------

2012 වර්ෂයේදී ආරක්ෂක, පවිත්‍රතා, භෝජනාගාර යනාදී සේවා සැපයීම් ප්‍රසම්පාදන පිළිබඳව පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ආරක්ෂක, පවිත්‍රතා, භෝජනාගාර යනාදී සේවා සැපයීම් කොන්ත්‍රාත්තු සඳහා ලංසු කැඳවීමෙන් තොරව, 2011 වර්ෂයේදී අවිධිමත් පරිදි ලබාගත් මිල ගණන් මත කොන්ත්‍රාත්තු ප්‍රදානය කර තිබුණු පෞද්ගලික සමාගමටම ඉහත කොන්ත්‍රාත්තු 03 හි ගිවිසුම්ගත කාලය 2012 වර්ෂය දක්වා දීර්ඝ කර කොන්ත්‍රාත් ප්‍රදානය කර තිබුණි.

(ii) කොන්ත්‍රාත්තු ගිවිසුම් අනුව පවිත්‍රතා සේවා සැපයීම සඳහා රු.224,930 ක් වූ මාසික ගාස්තුව 2012 අප්‍රේල් මස සිට රු.284,212 ක් දක්වා රු.59,282 කින් අවිධිමත් ලෙස වැඩිකිරීම හේතුවෙන් ආයතනයට 2012 වර්ෂයේදී රු.533,538 ක පාඩුවක් සිදුව තිබුණි.

4.7 කාර්ය මණ්ඩල පරිපාලනය

-------------------------------

ආයතනයේ අනුමත සේවක සංඛ්‍යාව 71 ක් වූ අතර තථ්‍ය සංඛ්‍යාව 22 ක් වූයෙන්, පුරප්පාඩු සංඛ්‍යාව 49 ක් විය. මෙම පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා මු.රෙ.71 ප්‍රකාර අනුමැතිය ලබා දී තිබුණද, 2012 දෙසැම්බර් 31 වන තෙක් සම්පූර්ණ කිරීමට කටයුතු කර නොතිබුණි.

5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

-----------------------------------------

5.1 සංයුක්ත සැලැස්ම

---------------------

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ උපදෙස් ප්‍රකාර 2012 – 2016 වර්ෂ සඳහා වූ සංයුක්ත සැලැස්ම පිළියෙල කර නොතිබුණි.

5.2 අභ්‍යන්තර විගණනය

-------------------------

මුදල් රෙගුලාසි 133 ප්‍රකාරව අභ්‍යන්තර විගණන අංශයක් ස්ථාපිත කර නොතිබුණි.

5.3 ප්‍රසම්පාදන සැලැස්ම

------------------------

රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශය සංග්‍රහයේ 4.2 මාර්ගෝපදේශය ප්‍රකාරව සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

6. පද්ධති හා පාලන

--------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු පිළිබඳව වරින් වර ආයතනයේ සභාපතිවරයා වෙත යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

(අ) ස්ථාවර වත්කම්

(ආ) හිඟහිටි ආදායම්

(ඇ) කොන්ත්‍රාත්තු පරිපාලනය

(ඈ) මානව සම්පත් කළමනාකරණය.

එච්.ජේ.එස්. සමරවීර

විගණකාධිපති.